This is a digital copy of a book that was preserved for generations on library shelves before it was carefully scanned by Google as part of a project to make the world's books discoverable online.

It has survived long enough for the copyright to expire and the book to enter the public domain. A public domain book is one that was never subject to copyright or whose legal copyright term has expired. Whether a book is in the public domain may vary country to country. Public domain books are our gateways to the past, representing a wealth of history, culture and knowledge that's often difficult to discover.

Marks, notations and other marginalia present in the original volume will appear in this file - a reminder of this book's long journey from the publisher to a library and finally to you.

Usage guidelines

Google is proud to partner with libraries to digitize public domain materials and make them widely accessible. Public domain books belong to the public and we are merely their custodians. Nevertheless, this work is expensive, so in order to keep providing this resource, we have taken steps to prevent abuse by commercial parties, including placing technical restrictions on automated querying.

We also ask that you:

+ *Make non-commercial use of the files* We designed Google Book Search for use by individuals, and we request that you use these files for personal, non-commercial purposes.

+ *Refrain from automated querying* Do not send automated queries of any sort to Google's system: If you are conducting research on machine translation, optical character recognition or other areas where access to a large amount of text is helpful, please contact us. We encourage the use of public domain materials for these purposes and may be able to help.

+ *Maintain attribution* The Google "watermark" you see on each file is essential for informing people about this project and helping them find additional materials through Google Book Search. Please do not remove it.

+ *Keep it legal* Whatever your use, remember that you are responsible for ensuring that what you are doing is legal. Do not assume that just because we believe a book is in the public domain for users in the United States, that the work is also in the public domain for users in other countries. Whether a book is still in copyright varies from country to country, and we can't offer guidance on whether any specific use of any specific book is allowed. Please do not assume that a book's appearance in Google Book Search means it can be used in any manner anywhere in the world. Copyright infringement liability can be quite severe.

About Google Book Search

Google's mission is to organize the world's information and to make it universally accessible and useful. Google Book Search helps readers discover the world's books while helping authors and publishers reach new audiences. You can search through the full text of this book on the web at `http://books.google.com/`

IndL
4027
10

Digitized by Google

Ind L 4 ...

Digha-Nikāya

ii. 9 (Rhys Davids, No 22)

vol. 2, p. 290.

This ed. is by

Batuwan Tudāwa

with the old Sanna of

Daramitipola

VE RI TAS

Harvard College Library

THE BEQUEST OF

Charles R. Lanman

PROFESSOR OF SANSKRIT

1880–1926

Digitized by Google

Digitized by Google

Digitized by Google

Mahāsatipatthāna Suttraya

129.
C

සන්නස සහිත

මහාසතිපට්ඨානසූත්‍රය.

ඩබ්ලිව්. ඩී. ලූවිස් අප්පුහාමි සහ

කේ. ඒ. ජේම්ස් පෙ‍්‍රරා අප්පුහාමිදු යන

අපිදෙදෙනා විසින්

කොළඹ

ශාස්ත්‍රාලෝක යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

ශ්‍රී බුද්ධ වර්ෂ—2427.

1883.

Digitized by Google

Ind L 4037.10

HARVARD UNIVERSITY LIBRARY
Mar 15, 1941

Prof Charles Rockwell Lanman

F

Digitized by Google

දැක්වීමයි.

Warren

අසරණ සරණ සරණාගත වජ්‍රපඤ්ජර කරුණානිධානවූ අපතිලෝගුරු බුදුරජානන් වහන්සේ මේ මහාභද්‍රකල්පයට සාරසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් ඔබ්බෙහි කුළුණුනුවණැති සුමේධනාං තාපසව දීපඞ්කරනම් බුදුරජානන් වහන්සේකෙරෙන් අෂ්ටධර්‍ම්ම සමෝධානයෙන්යෙදී නියතවිවරණශ්‍රීලැබ එතැන්පටන් ලොවපහළවූ සියළුබුදුවරයන්දැක ලබනලද විවරණශ්‍රීඇතිව දානාදී සමතිස්පෙරුම්පුරා තුසීපුරපැමිණ දසදහසක්සක්වල දෙවියන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත්පුරයෙහි ශාක්‍යකුල පරිශුද්ධ සුද්ධෝදන මහරජහුනිසා මහාමායාදේවීන් කුසපිළිසිඳ දසළුකඩමසකින් මව්කුසින්බිහිව ක්‍රමයෙන් වැඩිවියපැමිණ සියළුරාජ්‍යශ්‍රීහැර මහබිනික්මන් නික්ම පැවිදිව සයඅවුරුද්දක් දුෂ්කරක්‍රියාකොට සත්වෙනිවර්‍ෂයෙහි බොධිවෘක්‍ෂයකරාපැමිණ තුදුස්රියන් විදුරසුන්හි වැඩහිඳ මාරපරාජයකොට සර්‍වඥපදප්‍රාප්තව සත්සතියවා බ්‍රහ්මාරාධනාවෙන් බරණැස ඉසිපතනයෙහි දම්සක්පවත්වා එතැන්පටන් මණ්ඩලත්‍රයෙහි දනව් සැරිසරා දහම් වැසි වස්වමින් සත්වානුග්‍රහ කර වදාරණ බුදුරජානන්වහන්සේ එක්කාලයක කුරුරටටවැඩවදාරා එහිවසන භික්‍ෂු භික්‍ෂුනී උපාසක උපාසිකාදී සිව්වනක් පිරිස නිති භාවනාවෙහියෙදී වසනබැවිනුද තීක්‍ෂණප්‍රඥාවෙන් සමන්විතබැවිනුද එමකුරුරටදී මේ මහාසතිපට්ඨාන සූත්‍රාන්ත ධර්‍ම්මදේශනාව දේශනාකොට වදාළසේක—ඒ සතිපට්ඨාන සූත්‍රදේශනාව උන්වහන්සේගේ පිරිනිවීමට ඉක්බිතිව මහාකාශ්‍යපස්ථවිරප්‍රමුඛ පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් රජගහනුවරදීකළ පළමුවෙනි ධර්‍ම්මසංගායනාවෙහිදී සංගායනාකොට දීඝනිකායෙහි මහාවර්ගයට අන්තර්ගත කරණලදී—මේසූත්‍රය එක්විසිතැනෙක විදර්ශනාදක්වා බණවර දෙකකින් නිමියේයි— ඒ එක්විසි තැනනම්—ආනාපාන, ඉරියාපථ, චතුසම්පජඤ්ඤ, පටිකූල මණසිකාර, ධාතුමණසිකාර, ශනපසභා—සිවථිකා නවයත් එකොටගෙණ කායානුපස්සනා වෙනි තුදුස්තැනෙක,, වෙදනානු පස්සනා, චිත්තානුපස්සනා, දෙක්හිදෙතැනෙක, පඤ්චනීවරණ, පඤ්චුපාදානස්කන්ධ, ආධ්‍යාත්මික, බාහිර, දොළොස්වැදෑරුම් ආයතන, සප්තබෝධ්‍යඞ්ග, චතුසත්‍යයයි, ධම්මානුපස්සනාවෙහි පස්තැනෙකැයි මෙසේ එක්විසිතැන් දක්වේයි—

Digitized by Google

සීලසම්පනනවූ මධ්‍යම ප්‍රඥාවෙහි පිහිටි උපාසකාදී යම් කිසිවෙක් මේ මහාසතිපට්ඨාන සූත්‍රයෙහි දෙසූපරිදි නොසික්මවා සත්හැවිරිදකිත් වැඩිනොවන සප්තාහයකින් අඩු නොවන කාලයක් භාවනාකෙළේනම් ඕහට මෙම ජම්මයෙහි අර්හත් ඵලය නොලැබේනම් අනාගාමි ඵලය ලැබේයයි මෙහිම අවසානයෙහි වදාළබැවින් බුදුසසුන්හි සැදැහැතියත්විසින් මෙය ගරුකොට භාවනාකටයුතුයි—

මේමහා සතිපට්ඨානසූත්‍රය කවරකලෙක කවරෙක්විසින් සන්නකරණ ලද්දේදැයි සඩකාරහිතව කිය නොහැක්කේය නුමුත් කීර්ත්තිශ්‍රී මහරජානන් දවස දරම්ටිපොළ මහානායක ස්ථවිරයන්වහන්සේ විසින් සන්න කරණ ලදැයිත් සමහරුන්ගේ කල්පනායි—මේපොත දීර්ඝකාලයක් අතින්අතට ලිවීමෙන් වැරදිසහිතව තිබුනේය සැදැහැති උපාසකාදීන්ට අර්ථෝද්ග්‍රහණය දුස්කරබැවින් බටුවන්තුඩාවේ පණ්ඩිතොතනමයාවිසින් ශුද්ධකොට අච්චුගසවා ප්‍රසිද්ධකරණලද අකාරාදියක්සහිත පෙළද පූර්ණසන්න කීපයක් සහ තවත් ඊට ඕනෑකරණ පොත්ද, එකතුකොට සමත්ථ තෙරුන් වහන්සේ නමක්ලවා හැකිපමණින් ශුද්ධකරවා—ඩබ්ලිව්. ඩී. ලූවිස්අප්පුහාමි සහ—කේ. ඒ. ජේම්ස්පේ්‍රරා අප්පුහාමිද—යන අපි දෙදෙනා විසින් අච්චුගසවා ප්‍රසිද්ධකරණලදී—

තවද මෙහි යම් ප්‍රමාදාදි දොෂයොඇද්ද එයලොකාභිවෘද්ධියපිණිස ප්‍රාඥයන්විසින් ශුද්ධකරණු ලැබේවා—

මේපොත නැවත මුද්‍රාඞ්කණයකිරීමේ අයිතිවාසිකම මෙහිනම්පෙන අපිදෙදෙනාටම තබාගත්බව දතයුතුයි—

නමොතස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

W.D.L. APPUHAMI

(1) එවං මෙ සුතං එකං සමයං භගවා කුරූසු විහරති කම්මාසදම්මං නාම කුරූනං නිගමො-තත්‍රඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං භගවා එතදවොච.

එවම්මෙසුතං, මෙ; (ආයුෂ්මත්වූ මහාකාශ්‍යපස්ථවිරයන්වහන්ස)මාවිසින්(මේ මහාසතිපට්ඨාන සූත්‍රාන්ත ධර්මදේශනාව;) එවංසුතං, (මේආකාරයෙන් අසනලද මෙසේ අසනලද) මෙසේම අසනලදී; නොහොත්—මෙ, මාගේ; සුතං, ඇසීම; එවං, මෙසේමැයි; (කෙසේද) එකංසමයං, (ගර්භාවක්‍රාන්ති සමය ජාතිසමයසංවෙගසමය අභිනිෂ්ක්‍රමණසමය දුෂ්කරක්‍රියා සමය මාරවිජයසමය සම්‍යක්සම්බොධි සමධිගමකාලසමය දෘෂ්ටධර්මසුඛ විහාරසමය අත්තහිත පටිපත්තිසමය පරහිත පටිපත්තිසමය දෙශනා සමය කරුණා කෘත්‍යසමය යනාදී දෙවිසිණිසුත් කෙරෙහි ප්‍රකාශසමයන් අතුරෙන්) එක්ධර්මදේශනාසමයෙක්හි; භගවා, (සත්පුණ්‍ය ලක්ෂණ ධරත්වාදී භාග්‍යයෙන් යුක්තහෙයින්) භගවත්නම්වූ සර්වඥ රාජොත්තමයානන්වහන්සේ; කුරූසු, කුරුනම් ජනපදයෙහිවූ; කම්මාසදම්මං නාම, කල්මාසධම්මනම්වූ; (කුරුනම් ජනපදවාසීන්ගේ;) නිගමො, නිගමග්‍රාමය ගෝචරග්‍රාමකොට; විහරති, වාසය කරණසේක;—තත්‍රඛො, (එසේ යම් නිගමග්‍රාමයක් ගෝචර ග්‍රාමකොට වැඩවාසයකර වදාරණසේක්ද) එකල්හි වනාහි; භගවා, (ප්‍රමාණාතික්‍රාන්ත ලෝකධාතුගත අනන්තාපරියන්ත සත්වයන්ට උත්තම ගෞරවස්ථානීයවූ) භාග්‍යවතුන්වහන්සේ; භික්ඛවොති, මහණෙනිකියා; භික්ඛූ ආමන්තෙසි, (කුරුරටවාසී; භික්ෂූන්ට ආමන්ත්‍රණයකොට) වදාලසේක; තෙභික්ඛූ, ඒ (කුරුරට නියංගම්හි වාසය කරණ්ණාවූ) භික්ෂූහු; භදන්තෙති, ස්වාමීන් වහන්සැයිකියා; භගවතො, (ඓශ්වර්යවීර්‍යයශස ශ්‍රීසංකල්පසිද්ධි ප්‍රයත්නාඛ්‍යයන ෂට්ගුණ්‍යපරිපූර්ණතායෙන් පරමොත්කෘෂ්ටයටපැමිණී) භාග්‍යවතුන්වහන්සේට; පච්චස්සොසුං, ප්‍රතිවචනදුන්නාහුය; භගවා

නාථ්‍යවත් බුදුරජානන් වහන්සේ; එතදවොච, (මේ වක්‍ෂ
මානප්‍රකාරවචනයෙන්) මෙසේ වදාලසේක;—— ඒ ලො
කස්වාමිවූ අපතිලොගුරු බුදුරජානන්වහන්සේ කවරප්‍රකාරය
කින්වැඩ කුරුරටවාසී භික්‍ෂූත්තම ආමන්ත්‍රණයකර වදාරා මේ
සූත්‍රාන්තදෙශනාව දෙශනාකොට වදාලසේක්දයත්——

හෙමෙසේ දතයුතු——

මෙ මහාභද්‍රකල්පයට විසතාසංඛ්‍ය කල්පලක්‍ෂයකින් ඔබ්
බෙහි බ්‍රහ්මදේවනම් බුදුරජානන්වහන්සේ දැක බුදුවීමෙහි ස
තුටුව දෘඪතර සමාදානයෙන් යෙදී එශ්පිහිටුවනලද සිත්ඇ
තිව එතැන්පටන් සතාසංඛ්‍ය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි ම
ණොප්‍රනිධානයපුරා. පුරාණගෞතම බුදුරජානන්වහන්සේදැ
ක බුදුගුණයෙහිපැහැද මමද මෙබඳු ශාක්‍යවංශයෙහි ඉපිද
බුදුවෙම්වයි වාක්ප්‍රභෙදයෙන් ප්‍රාර්ථනාකොට—එතැන්පටන්
නවාසංඛ්‍ය කල්පලක්‍ෂයක් මුළුල්ලෙහි වාක්ප්‍රනිධානයපුරා—
සාරාසඞ්ඛ්‍ය කල්පලක්‍ෂයකින් ඔබෙබහි බුදුවූ දීපංකරණම් බු
දුරජානන් වහන්සේ කෙරෙන් අෂ්ටධම්ම සමෝධානයෙන්
යෙදී නියතවිවරණශ්‍රීලැබ. එතැන්පටන් ලොවපහළවූ සිය
එබුදුවරයන්දැක කරණලද අධිකතර පූජාවන්ඇතිව දානාදී
සමතිස්පෙරුම්පුරා තුසිපුරපැමිණ දශදහසක්සක්වල දෙවිය
න්ගේ ආරාධනාවෙන් කිඹුල්වත්පුරයෙහි ශාක්‍යකුල පරිශුඞ
ශුඞොදන මහරජහුනිසා මහාමායාදෙවීන්කුස පිළිසිඳගෙ
ණ දශඑකඩමසකින් මව්කුසින්බිහිව ක්‍රමයෙන් වැඩිවියපැ
මිණ මහභිනික්මන්නික්ම පැවිදිව සයහව්රුද්දක් දුෂ්කර
ක්‍රියාකොට සත්වෙනිවර්ෂයෙහි වෙසඟපුර පසලොස්වක්දින
යෙහි අශ්වත්ථබෝධි වෘක්‍ෂමූලයෙහි විදූරසූත්හිවැඩහිඳ සපරිවා
ර මාරපරාජයකොට ලොව්තුරාබුදුව සත්සතියවා බ්‍රහ්මාරා ධ
නාවෙන් බරණැස ඉසිපතනත්හි දම්සක්පවත්වා එතැන්පටන්
මණ්ඩලත්‍රයෙහි දනව්සැරිසරා දහම්වැසිවස්වා සත්වානුග්‍රහකර
වදාරණ බුදුරජානන්වහන්සේ—එක්කාලෙක කුරුදේශයට වැ
ඩ එහිකල් මාස පාදයනනාමක්ඇති පෝරිසාදයන්ගේ පය
කතුවෙකඇවිනි විදිතැනමස්නැගී වනයරුහණයෙන් චිත්‍රද
රුසඳසවූ කැලලක්සිටිහෙයින් හෙතෙම කල්මාසපාදයොය
යනනාමක්ලද්දේය-ඒ පෝරිසාදයන්ට මහබෝසතානන්විසි
න් එමප්‍රදේශයෙහිදී බණකියා දමණයකල කාරණයෙන්ද ල
දනම්ඇති කම්මාසදම්මනම්වූ එමස්ථානයෙහි කරණලද ග්‍රා
මයද කම්මාසදම්ම නිගමග්‍රාමනම්විය—ඇතම්කෙනෙක්

Digitized by Google

පළමු ඒ කුරුරටවාසීන්ගේ කුරුධම්මනම් වෘතසමාදානය එම
ස්ථානයෙහිදී පැවැත්වූ කාරණය හේතුකොටගෙණ කම්මා
සසධම්මනම් වියසිකියා දකාර ධකාරයෙහියොදා කියති එම
ගුණධම්ම හේතුකොටගෙණ එහි උතුරුකුරුදිවයිනමෙන් සු
ලභවූ සියළුමසම්පත් ඇත්තේය එහෙයින් ඒ රටද කුරුරටනම්
වියසිකියා අත්ථවණ්ණනාකෙරෙත්—මෙසේ නොයෙක්ආකා
රයෙන් කම්මාසසධම්මනම්වූ ඒ නිගමග්‍රාමය ගෝචරග්‍රාම
කොට එහි බුදුන්ට වැඩවිසීමට නිසිලෙස්කරණලදද අමුතුවිහා
රයක් නැතිසෙයින් ඡිටතුඩුරු නොලත්වූ උදකසම්පන්න
ශීතාසීත්කාළවූ රම්‍යභූමිභාගඇති වනලැහැබෙක වාසයකර
ණ භාග්‍යවතුන්වහන්සේ එසමයෙහි කුරුරට භික්ෂූන්ට ආ
මන්ත්‍රණයකොට වදාරා මේ සතිපට්ඨාන සූත්‍රධම්මදෙශනාව
දෙශනාකර වදාලසේක— ඒකුරුරටවාසීහු නම් මහාමන්ධාතු
නම් චක්‍රවර්ත්තිරජකල ඒ රජ සතරමහද්වීපවාසීන්ට අනුශාස
නාපිණිස වැඩිගමනෙහි සෙසු තුන්දිවයින්වලින්ම චක්‍රරත්
නානුභාවයෙන් කැමතිතාක් අහසටනැගී ඒ රජහාඑක්ව ආ
සේනාව දඹදිවට පැමිනෙය නැවත ඒරජ මෙයටවඩා දෙ
ව්ලොවසැප උතුමැයිඅසා එහියනුකැමතිව එසේම සපිරිවර
සේනාවසහිතව චාතුම්මහාරාජික දෙව්ලොවටපැමිණ එයින්
නික්ම ශක්‍රපුරයටයනකල්හි ඒ රජඑක්වගිය සියළුමපිරිස එ
තැන්හීනැවතී චක්‍රරත්නයහා එක්ව දඹදිවටමබැස චක්‍රරත්
නය දෙවනුගමන් නැතිසෙයින් ඒ හැමදෙනම දඹදිවමර
ණසීට ඒ රජහුගේ ප්‍රධාන පුත්‍රුවන්වූ පරිනායකරත්නයකරා
පැමිණ ස්වාමීනි අපටවිසීමට නිසිභූමිප්‍රදේශයක් දුනමැනවැ
යිකියා ඉල්වාගෙණ ඒ හැමදෙන දඹදිවම විසූවාහුය— එ
හෙයින් පූර්‍වවිදේහයෙන් ආමිණිසූන් විසූරට පලමුසඟියුලෙ
සම විදේහරටනම්විය අපරගෝයානයෙන් ආමිණිසූන්විසූ
රට අපරන්තකනම් දනාව්විය උතුරුකුරුදිවයිනෙන් ආමිණි
සූන්විසූරට කුරුරටනම්විය—එසේලද නම්ඇති ඒ කුරුදේශ
ය ඍතුප්‍රත්‍යාදියෙන් සමෘද්ධසම්පන්නය කල්නොවරදවා ඒ ඒ
කලට නිසිලෙසපවත්නා වර්‍ෂාශීතෝෂ්ණාදි ඍතු යහපත්ව පැ
වතිමෙන් සුලභවූ ආහරපානවස්ත්‍රාදීන්ගේ සමෘද්ධතායෙන් එ
හිවසන භික්ෂුභික්ෂුණී උපාසක උපාසිකායන සිව්වනක් පාරි
සද්‍යයන්ගේම සැපවිහරණ ඇත්තේමය—එසේම ප්‍රත්‍යාදීන්
කලානතවීමක්නොව සැපවිහරණඇතිබැවින් නිරෝගිව ප්‍ර
සන්නවූ අකක්කසමෘදු මනාශරීරහා සිත්ඇත්තාහුය එසේම
ප්‍රත්‍යයෙන් කලානතව වියලීමෙන් සූෂ්කව කායචිත්ත පී

ධාවක්නොව සුලභතාවය හේතුකොටගෙණ ලබනලද ප්‍ර
ඥබලඇතිහෙයින් ඒ රටවාසීහු ගම්භීරධම්මකථාඅසා පිලිගැ
න්මට සමත්ථහෙයිනුදු තවද ඒ දනව්වැසි සිව්වනක්පිරිස්හුම
දානසීලභාවනාදී කුසලධම්මයන්හියෙදී අප්‍රමාදව වසනබැ
වින් ස්වභාවයෙන්ම සතිපට්ඨාන භාවනාවෙහියෙදී වාසය
කරන්නාහුය එහෙයින් යටත්පිරිසෙයින් එහිවසන දාසිදස්
කම්කරු පිරිවරජනයෝදපවා එක්වූවිට සතිපට්ඨාන ප්‍රතිසං
යුක්ත කථාවක්ම කරන්නාහුය එහෙයින් පැන්තොටට යන
එනතැන්හා නූල්කටිනාතැන් ආදිවූ ඒ ඒ තැන්හී එක්වූ ස්ත්‍රී
හුවිනමුත් නිරර්ථක කථා පැවැත්වීමක් නැත්තාහ ඉඳින් ය
ම්කිසි ස්ත්‍රියක් අනික්ස්ත්‍රියකට මෑනියෙනි තෙපි කවරසතිප
ට්ඨාන භාවනාවක් සිහිකරන්නීදැයි විචාලකල කිසිභාවනාව
කුත් නැතැයිකියා ඈ කිවහොත් ඈට ගර්හාකොට තොපගේ
ජීවිතයට නින්දාවේවයිකියා ජීවත්වීනමුදු මලවූත්වැන්නීය
මෙසේ ප්‍රමාදවීමක් නැවත නොකරවයිකියා අවවාදකොට
ඈට එක්තරා සතිපට්ඨාන භාවනාවක් උගන්වන්නාහුය—ය
ම්ස්ත්‍රියක් මම අසවල් සතිපට්ඨානභාවනාව සිහිකෙරෙමියි කි
යානම් ඈට ඉතාප්‍රසංසාකොට සාධුකාරදී තොපලද ජීවිත
ය ජීවිතනම්වෙයි මිණිසත්බවට තොපිම පැමිනියානම්වෙයි
තොපට වැඩපිනිස බුදුරජානන්වහන්සේද ලොව පහලවූසේ
කැයි යනාදින් ප්‍රසංසාකරන්නාහුය—එහිවසන මිණිසත්බව්
ලත්අය අප්‍රමාදව භාවනායෙහි යෙදීසීම කුමණාවිශ්මයෙ
ක්ද තිරිසන්ජාතියෙහි උපන් ගිරාපෝතකයෙකු පෝෂ්‍යය
කොට හික්මවාගෙණ ඇවිදිනා එක්තරා නාට්‍යකාරදුෂීයෙ
ක් ඒ කුරුණම් නියංගම භික්ෂුණීන්වසන ආරාමයකට්පැමිණ
එහිවැස නික්මයනකල ඒ ගිරාපෝතකයාව සිහිනොව ගෙ
නම ගියහෙයින් සාමණේරීහු ඕහට බුඩරක්ඛිතයයිකියා
නාමක්තබාගෙණ රක්ෂාකෙරෙති එකල්හී එක්දවසෙක අභි
මුඛයෙහිහුන් ගිරවානන්දක මහාසථවිරීගතාමෝ බුඩරක්ඛි
තය තාගේ කිසියම්භාවනා සිහිකිරීමෙක්ඇද්දැයි විචාරණ
ලදුව නැතස්වාමිනීයිකීහ එවිට සථවිරීතොම කියන්නී ප්‍රව්‍රා
ජිතතැන් සමීපයෙහි වසන්නාහුවිසින් තමාගේ ආත්මභාවය
සිහිනොකරවිසීම නුසුදුසුය එහෙයින් අනිකක් තටනොපි
ලිවන අට්ඨිඅට්ඨිකියා ශරීරයාගේ ඇට්සැකිලිබව දැනහදැර
වයිකියා භාවනාවෙහි හික්මෙව්වාහුය එතැන්පටන් එම අ
වවාදයලෙස භාවනායෙහි හැසිරවසන ඒ ගිරවානන් එක්
දවසක් සූර්‍යතපතපිමින් තොරණඅගසිටිකල එක්පක්ෂියෙක්

Digitized by Google

නබපඤ්ජරයෙන් ගසාගෙණ ගියේය ඒ දැක සාමණේරිහු ඔහු
එහුබඳවාගොස් ගලවාගෙණඅවුත් බුඩරක්ඛිතය පක්‍ෂියාවිසි
න් ගෙණයනකල්හි තෝ කුමක්සිතුයෙහිදැයි විචාලකල ස්වා
මිණී ඇටසැකිලෙලක් ඇටසැකිල්ල ගෙණයන්නේය කවරතැ
ණෙක්නී වැගිරයෙදොනෝයි කියා ඇටසැකිලිබවම ස්වාමිණී
මම සිහිකෙළෙමියි කීයේය—එකල්හි ථෙරීතෙමේ සාධු සාධු
බුඩරක්ඛිතය තට අනාගතභවයට මේ කුසලයම ප්‍රත්‍යයවන්
නේයයි කියා ප්‍රසංසාකෙළේය—මෙසේ එහිවසන්නාහු භා
වනායෙහි ඇළුම්ඇතිහෙයින්ද යනාදී නොයෙක් කාරණ
යෙන් අපභාග්‍යවතුන්වහන්සේ ඒ කුරුරටවාසීන්ට මේ සති
පට්ඨාන සූත්‍රදේශනාවෙන්වන මහත්අභිවෘඩියම දැකවදාළ
යම්සේ පුරුෂයෙක් රන්කරඬුවක්හෝ ස්වර්ණමඤ්ජුෂයක්හෝ
ලැබ අනේක ප්‍රකාර විසිතුරුමල් මුතු මැණික් ආදිවූ මාහැඟි
රත්නයන් එහි සුරක්ෂිතකොටතබා රක්‍ෂාකරන්නේද එපරිද්
දෙන්ම අපභාග්‍යවතුන් වහන්සේද ගම්භීර ධම්මයන් පිළිගැ
ණීමෙහි සමර්ථවූ කුරුරටවාසී පිරිසලදින් මෙසින් අන්‍යවූද
ගම්භීරාර්ථ ඇති දීඝනිකායෙහිම—මහානිධාන සූත්‍රය—මඩ්‍යම
නිකායෙහි සතිපට්ඨාන සූත්‍රය—සාරොපම සූත්‍රය—රුක්ඛූපම
සූත්‍රය-රට්ඨපාල සූත්‍රය-මාගන්‍දිය සූත්‍රය-ආනඤ්ජසප්පාය සූත්‍රය-
සහඅන්‍යවූද නොයෙක් සූත්‍රදෙශනාවන් ඒ කුරුරටදීම පැ
වැත්වූසේක—එසේ නොයෙක්ගැඹුරු ධම්මයන් පිළිගැණි
මෙහි සමර්ථහෙයින් සඩම්මවර චක්‍රවර්ත්තිස්වාමිවූ තිලෝගුරු
බුදුරජානන්වහන්සේ අනන්තාපරිමාණ බුද්ධවරයන්ටගෝචර
වූ එක්විසිතැනෙක්හි කම්මස්ථාන ප්‍රකාශකොට අර්හත්ඵලනැ
මති කොත්පලඳවාළීමෙන් කූඨගත්වා දෙශනාකරණලද
ඉතා මහත් ගම්භීරාර්ථ ඇති මේ මහාසතිපට්ඨාන සූත්‍රදෙශ
නාවද ශ්‍රඩාබුඩිසම්පන්න ඒ කුරුරටවාසීවූ සිව්වනක් පිරිසට
දෙශනාකිරීමෙන් මහත්වැඩදායක අභිවෘඩිවනබව දැකවදා
රමින් ඒ භික්‍ෂුභික්‍ෂුණී උපාසක උපාසිකායන සිව්වනක් පිරි
ස්අතුරෙන් භික්‍ෂුපිරිසම ප්‍රධානහෙයිනුද සියළුබුඩානුශාසනා
පිළිගැණීමෙහි සමර්ථහෙයිනුද භාග්‍යවතුන්වහන්සේගේ සමී
පයෙහි නිතිහැසිරෙණහෙයිනුද භික්ඛවොයිකියා ආමන්ත්‍රණය
කොට වදාලකල ඊට අනතුරුව ස්වාමිණී බුදුරජානන් වහන්
සැයිකියා ප්‍රතිවචනදුන්වා බුඩතේජසින් තැතිගෙණ බුඩගෞ
රවයෙන් එලහරිත සඳලිරුස් සෙයින් බුදුන්දිසාවට නම්නාව
පිරිවරාහුන් කුරුරටවාසී භික්‍ෂූන්ට—එකායනො අයංභික්ඛ
වෙ මග්ගො යනාදීන් මේ සතිපට්ඨාන සූත්‍රදේශනාවට ප
ටන්ගත්සේක—

(2) එකායනො අයංභික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා සොකපරිද්දවානං සමතික්කමාය දුක්ඛදොමනස්සානං අත්ථගමාය ඤායස්ස අධිගමාය නිබ්බාණස්ස සච්ඡිකිරියාය යදිදංචත්තාරො සතිපට්ඨානා—

භික්ඛවෙ, මහණෙනි, සත්තානං, (රාගාදි කෙලෙසයන්ගෙන් කිළුටුවූ සිත්ඇති) සත්වයාගේ; විසුද්ධියා, (විසුද්ධිසංඛ්‍යාත) පිරිසිදුවීමපිණිසද; සොකපරිද්දවානං, සෝකපරිදේවයන්ගේ; සමතික්කමාය, ඉක්මවීමපිණිසද; දුක්ඛදොමනස්සානං (කායිකදුක්ඛය චෛතසික දෞර්මණස්‍ය යනමේ) දුක්දොම්නස් දෙදෙනාගේ; අත්ථගමාය, නැසීමපිණිසද; ඤායස්ස, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයාගේ; අධිගමාය, පැමිණීම පිණිසද; නිබ්බාණස්ස, නිර්වාණනම් උතුම්අමාතයාගේ; සච්ඡිකිරියාය, (අවබොධවීමෙන්) ප්‍රත්‍යක්ෂ කිරීමපිණිස (පවත්නාවූ); යදිදංචත්තාරො සතිපට්ඨානා, යම් මේ සතරසතිපට්ඨාන කෙනෙක්ඇද්ද; අයං, මේතෙම; එකායනොමග්ගො, අයනසංඛ්‍යාතවූ එකම මාර්ගයෙක් වන්නේයයි වදාළසේක—

මෙසේ එකායනො මග්ගො යනුවෙන් එකායනමාර්ගය ප්‍රකාශකොට දක්වාවදාරණ භාග්‍යවතුන්වහන්සේ සත්වයන්ට නිවන්පුරවැදීමට මේ සතිපට්ඨාන භාවනාමාර්ගයහැර මීට දෙවෙනිවූ අන්කිසිමාර්ගයක් නැතිහෙයින්ද—ගණසංගනිකායෙන්දුරුව විවේකව හුදකලාව පිළිපැද්දයුතු භාවනාමාර්ගය හෙයින්ද මේ එකම බුද්ධශාසනයෙහිමුත් අනික්තැනක නැති හෙයින්ද මේභාවනා මගටවඩා එකම නිවන්පුරයට පැමිණීමට අන්කිසි මාර්ගයක්නැතිහෙයින්ද යනාදි නොයෙක්අර්ථයන් හේතුකොටගෙණ එකායනමාර්ගයයි වදාරණලද මේ පදයෙහි අර්ථයහේතුකොටගෙණ පූර්වයෙහිද මහතෙරුන්වහන්සේලාගේ ධම්මසාකච්ඡා පහළවිය—ඒ කෙසේදයත්—ත්‍රිපිටක චූලල නාගතෙරුන්වහන්සේ වදාරණසේක් සතිපට්ඨාන සූත්‍රදේශනාවෙහි එකායනො මග්ගොයන මේපදයෙන් ප්‍රකාශවූයේ ශ්‍රොතාපත්ති මාර්ගාදීන්ට පූර්වභාගවූ කායානුපස්සනාදි සතරසතිපට්ඨානයන් අරමුණුකොට පවත්නා භාවනාමාර්ගයයි වදාළසේක. උන්වහන්සේගේ ආචාර්‍ය්‍යවූ ත්‍රිපිටක චූලලසුමනනම් තෙරුන්වහන්සේ ඒ අසා ඇවැත්නි ඒ ආර්‍ය්‍යමාර්ගයන්හා සතිපට්ඨාන භාවනාමාර්ගසහිතවූ මිශ්‍රකමාර්ගයයි වදාළසේක—එවිට ශිෂ්‍යවූ එම ත්‍රිපිටක චූලලනාගතෙරුන්වහන්සේ ස්වාමීන්වහන්ස ලෝකෝත්තරවූ ආර්‍ය්‍යමාර්ගයට පැමිණෙන්නාහු විසින් මේ සතිපට්ඨා

න භාවනාමාර්ගය වැඩීමෙන්ම පැමිණියයුතුය එහෙයින්
ම පූර්වභාගනම් ලද මේ සතිපට්ඨාන භාවනාමාර්ගයම මෙහි
අභිප්‍රායයි නැවතත් දැන්වූසේක—ඒ අර්ථ ආචාර්‍ය්‍යයන්වහන්
සේ නැවතත් මිශ්‍රකමාර්ගයයි වදාලසේක—එකල්හි ශිෂ්‍යවූ
චූලනාගතෙරුන්වහන්සේ කිසිවක් නොවදාරා තුෂ්ණීම්භූ
තවූසේක එහෙයින් ප්‍රශ්නය නොනිමිකල්හිම දෙදෙනාවහ
න්සේම නැගීවැඩිසේක——නැවතත් ඒ ආචාර්‍ය්‍යතෙරුන්වහ
න්සේ සවස්වේලෙහි නහණතොටුවට වඩිමින් සිතනසේක්
මමවනාහි එකායනමාර්ගයම නිර්වාණට මාර්ගවනබැවින් ලො
කොත්තරමාර්ගයහ—සතිපට්ඨානමාර්ගය එකක්කොටගෙණ මි
ශ්‍රකමාර්ගයයි කීමි—චූලනාගයො ඒ පූර්වභාගවූ සතිපට්ඨාන
භාවනා මාර්ගයයි කියති එයින් කවරඅර්ථයක් ගතයුතුදෝ
හොයිසිතා සූත්‍රාන්තය මූලපටන් අර්ථපරිවර්ත්තනයෙන් අල
ලාබලමින් ගොස්—යොහිකොචි භික්ඛවෙ ඉමෙචත්තාරො
සතිපට්ඨානෙ එවංභාවෙය්‍ය සත්තවස්සානීති යනමේ ස්ථා
නයටපැමිණ එහි අර්ථ සලකනසේක්—යොහි කොචි—යන්
නෙන් ප්‍රකාශවූ සියළුම සිව්වනක් ඒ පිරිස්අතුරෙණ් ගිහිව ව
සන්නෙක් ලොකොත්තරවූ රහත්මගටපැමිණ සත්වර්ෂයක්
ගෘහවාසයෙහි එම ආර්‍ය්‍යගුණයෙන් යෙදීසිටීමක්නැත එහෙ
යින් මාවිසින් මිශ්‍රකමාර්ගයයි දැක්වූ අර්ථය ගතයුතු නො
වෙයි මාගේශිෂ්‍යවූ චූලනාගයන්විසින් දැක්වූ ලොකොත්ත
රමාර්ගයට පූර්වභාග සතරසතිපට්ඨාන භාවනාමාර්ගයයි දැක්වූ
අර්ථයම ගතයුතුයයි සිතා එමදැම අටවක්දිනයෙහි ධර්මදේ
ශනාචාර්‍ය්‍ය චූලනාග ස්ථවිරයන්ට පැමිණ මෙම සතිපට්ඨාන
සූත්‍රදේශනාවට ප්‍රාරම්භව ධර්මාසනාරූඪව හුන්කල්හි ධර්ම
ශ්‍රවන කාලඝොෂාශබ්දය අසා ආචාර්‍ය්‍යවූ ඒ මහතෙරුන් ව
හන්සේ එතනට පැමිණ ඊර්ෂ්‍යාමාණනැතිවම ඇවැත්වූ චූල්ල
නාගයෙනි මාවිසින් දැක්වූ මිශ්‍රකමාර්ගයයි යනවචනයහැර
තෙපි දැක්වූ පූර්වභාගමාර්ගයයි යනවචනයම ගෙණ එකායන
මාර්ගයෙහිම අර්ථකියයුතුයයි වදාලසේක——ඒ වචනයඅසා
උන්වහන්සේ මැණවැයිකියා පිලිගෙණ සිතනසේක් අප
ගේ ආචාර්‍ය්‍යවූ සියළුත්‍රිපිටක පර්‍ය්‍යාප්තිධර ශ්‍රැත බුද්ධවූ මෙබඳු
බහුශ්‍රැත භික්ෂූන්වහන්සේට පවා මේ ප්‍රශ්නයඇලලී ගැඹුරු
වපෙනීගියේය එහෙයින් අනාගතයෙහි පැවිදිවන මාගේ
මලනුවරුන්ට එසේනොවනසේ සූත්‍රය ගෙණහැරදක්වා නි
ශ්චලකෙශරම් සිතාවදාරා පටිසම්භිදානමාර්ගයෙන් උදාහරණ
යක්ගෙණ පූර්වභාගයෙහි සතිපට්ඨාන භාවනාමාර්ගයම එ

කායන මාර්ගයයි කියනුලැබෙයි වදාරා——මග්ගො නට්ඨඞ්ගිකො සෙට්ඨො——පෙ——* යනුවෙන් ප්‍රකාශවූ සම්‍යක්දෘෂ්ටි ආදී ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට ඇතුලත් සම්මාසතියන පදාර්ථයෙහි පෙණීසිටි මෙම සතිපට්ඨාන භාවනාවම නිර්වාණයට භාවනාමාර්ගනම්වෙයි මෙයින්පිටත් අන්කිසිමාර්ගයක් නැතැයියනා මේ පාලිකුමය දැක්වීමෙන් මෙසේ ප්‍රශ්නය නිශ්චල කොට විසඳූසේක——

කතමෙ චත්තාරො.

ඉධභික්ඛවෙභික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපීසම්පජානො සතිමාවිනෙය්‍යලොකෙ අභිජ්ඣාදොමනස්සං වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍යලොකෙ අභිජ්ඣාදොමනස්සං චිත්තෙ චිත්තානුපස්සීවිහරති ආතාපී සම්පජානො සතිමාවිනෙය්‍යලොකෙ අභිජ්ඣාදොමනස්සං ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමාවිනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං——

කතමෙ චත්තාරො, ඒ සතර සතිපට්ඨානයෝනම් කවරහයත්; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ සර්වඥ ශාසනයෙහි; භික්ඛු, මහණතෙම; කායෙ, (විශේෂයෙන් පිලිකුල්කටයුතු චතුර්මහාභූතවූ) මේ ශරීරයෙහි (ඒකාන්ත අශුභබවදැන;) ආතාපී, කෙලෙසුන් තවනවීර්‍ය්‍යඇති; සම්පජානො, සම්පජඤ්ඤයයි කියනලද ඥාණයෙන් සමන්විතවූ; සතිමා,(කායපරිග්‍රාහික සතියයි කියනලද ශරීරයාගේ අසාර අශුභවසයෙන් කයසිහිකරන්නාවූ) සිහියෙන්යුක්තවූයේ; ලොකෙ, ලූජ්ජන පලුජ්ජනාර්ථයෙන් ලෝකනම්වූ මේ ශරීරයෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි කියනලද ලොභයද; දොමනස්සං, ව්‍යාපාදයයි කියනලද නොසතුටුබවද (යනමේ පාපධර්මයන්;) විනෙය්‍ය, අනිත්‍යාදි නොයෙක් ආදීනවකාරණයන් සිහිකිරීමෙන් පාපයට අවකාශනොදී) සංසිඳුවාගෙණ; කායානුපස්සීවිහරති, කායගතාසතිභාවනාව සිත්හීකරමින් වාසයකරන්නේ; වෙදනාසු, සුඛදුක්ඛ උපෙක්‍ෂාවසයෙන් නොයෙක්ප්‍රකාරවූ) වෙදනාවන්කෙරෙහි; ආතාපී, කෙලෙසුන්තවන වීර්‍ය්‍යඇති; සම්පජානො, සම්පජඤ්ඤනම් ලද ඥාණයෙන් යෙදීමෙන් (වාසය

---

* මග්ගො නට්ඨඞ්ගිකො—යනාදි ගාථාවයක්සහිත විස්තර අටුවාවෙන් බලාදතයුතු.

Digitized by Google

කරන්නාවූ;) සතිමා, (වේදනා පරිග්‍රාහිත සිහියයි කියනලද
සුවදුක්ආදි නොයෙක් වේදනාවන්ගේම ඒකාකාරව නොසි
ටවහා බිඳියාමෙන් දියබුබුළුසේ අසපිරවූ ඒකාකාරව නොප
වත්නාසවභාවය සිහිකරන්නාවූ) සිහියෙන් යුක්තවූ (තැනැ
ත්තේ;) ලොකෙ, (පුථුජ්ජන පලුජ්ජනාත්ථයෙන් හෙවත් විශෙ
ෂයෙන් නැතිවනකාරණයෙන් ලොකනම්වූ සුවදුක්ආදිය
විඳිම්වසයෙන් පවත්නා මේ) වෙදනාලෝකයෙහි; අභිජ්ඣා,
කාමච්ඡන්දයයි කියනලද ලෝභයද; දොමනස්සං, ව්‍යාපාදය
යි කියනලද නොසතුටුබවද (යනමේ පාපධම්මයන්;) ,විනෙ
ය්‍ය, (විෂ්කම්භනාදි වසයෙන්) සන්සිඳුවාගෙණ; වෙදනානු
පස්සීවිහරති, (වේදනාවන්ගේ සවභාවාදි නවසිහිකාරණ) වෙ
දනානුපස්සනා භාවනාසිත්හි කරමින් වාසය කරන්නේය;
චිත්තෙ, (රාගදෙවෂ මොහාදි නොයෙක්ප්‍රභෙදඇති)චිත්තයෙ
හි; ආතාපී, කෙලෙසුන් තවනවීර්‍යයඇත්තාවූ; සම්පජානො,
සම්පජඤ්ඤ සංඛ්‍යාත ඥාණයෙන් සමන්විතවූයේ; සතිමා,(චි
ත්ත පරිග්‍රාහික සිහියයි කියනලද චිත්තයාගේ සවභාවාදි න
වසිහිකරන්නාවූ) සිහියෙන්යුක්තව (වාසයකරණ තැනැත්
තේ;) ලොකෙ, (ඇතිව නැතිවන කාරණය හේතුකොටගෙ
ණ පුථුජ්ජන පලුජ්ජනාත්ථයෙන් ලොකනම් ලදචිත්ත) ලොක
යෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි කියනලද ලොභයද; දො
මනස්සං, නොසතුටුබවද (යනමේ පාපධම්මයන්;) විනෙය්‍ය,
(තදඞ්ග විෂ්කම්භන වසයෙන්) සන්සිඳුවාගෙණ; චිත්තානු
පස්සී විහරති, චිත්තයාගේ සවභාවාදි නවසිහිකාරණ භාව
නාව මෙනෙහිකරමින් වාසයකරන්නේය; ධම්මෙසු, (පඤ්ච
නීවරණ ධම්මයන්ආදිවූ) ධම්මයන් කෙරෙහි; ආතාපී, කෙ
ලෙසුන් තවනවීර්‍යයඇති; සතිමා, සිහියෙන් සමන්විතවූයේ;
සම්පජානො, සම්පජඤ්ඤයයි නම්ලද ඥාණයෙන් යුක්තවූයේ;
ලොකෙ, (යථොක්තාර්ථ යෙන් ලොකයයි ලදනම්ඇති නී
වරණාදි ධම්ම) ලොකයෙහි; අභිජ්ඣා, කාමච්ඡන්දයයි නම්ලද
ලොභයද; දොමනස්සං, ව්‍යාපාදයයි නම්ලද නොසතුටුබ
වද (යනමේ පාපධම්මයන්;) විනෙය්‍ය, සන්සිඳුවා (නිශ්චල
වහිද;) ධම්මානුපස්සී විහරති, (නීවරණාදි ඒ ඒ ධම්මයන්ගේ
සවභාවාදි නවසිහිකරණ) ධම්මානුපස්සනා භාවනාවසිහිකර
මින් වාසය කරන්නේය.

උද්දෙසවාරං

මෙසේ උදෙස්විසින් සතර සතිපට්ඨාන දේශනාව සංක්ෂේ
පකොට දක්වාවදාරා නිද්දෙස්විසින් විස්තර දේශනාකාරණ

ධම්මාධිපති ධම්මධජ ධම්මකාය ධම්මරජත්වූ සර්වඥ රාජො
ත්තමයානන් වහන්සෙ කථංචභික්ඛවෙ භික්ඛු කායෙ කායා
නුපස්සීවිහරති යනාදීන් තමන්වහන්සේම ප්‍රශ්නකොට ම
තුදක්වන ක්‍රමයෙන් විස්තරවූ කායානුපස්සනා සතිපට්ඨාන
දෙශනාවට පටන්ගත්සේක—

(3) කථංචභික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති—
ඉධභික්ඛවෙ භික්ඛු අරඤ්ඤ ගතොවා රුක්ඛමූල ග
තොවා සුඤ්ඤාගාර ගතොවා නිසීදති පල්ලඞ්කං ආ
භුජිත්වා උජුංකායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨ
පෙත්වා සොසතොව අස්සසති සතො පස්සසති
දීඝංවා අස්සසන්තො දීඝං අස්සසාමීති පජානාති
දීඝංවා පස්සසන්තො දීඝං පස්සසාමීති පජානාති
රස්සංවා අස්සසන්තො රස්සං අස්සසාමීති පජානාති
රස්සංවා පස්සසන්තො රස්සං පස්සසාමීති පජානාති
සබ්බකාය පටිසංවෙදී අස්සසිස්සාමීති සික්ඛතිසබ්බ
කාය පටිසංවෙදී පස්ස සිස්සාමීති සික්ඛති පස්සම්භ
යං කායසංඛාරං අස්සසිස්සාමීති සික්ඛති පස්සම්භයං
කායසංඛාරං පස්සසිස්සාමීති සික්ඛති සෙය්‍යථාපි
භික්ඛවෙ දක්ඛො භමකාරොවා භමකාරන්තෙවා
සීවා දීඝංවා අඤ්ඡන්තො දීඝං අඤ්ඡාමීති පජානාති
රස්සංවා අඤ්ඡන්තො රස්සං අඤ්ඡාමීති පජානාතිඑව
මෙවඛො භික්ඛවෙ භික්ඛු දීඝංවාඅස්සසන්තො දීඝං
අස්සසාමීති පජානාති දීඝංවාපස්සසන්තො දීඝංපස්ස
සාමීති පජානාති රස්සංවා අස්සසන්තො රස්සං අස්ස
සාමීති පජානාති රස්සංවා පස්සසන්තොරස්සං පස්ස
සාමීති පජානාති සබ්බකාය පටිසංවෙදී අස්සසිස්ස
මීති සික්ඛති සබ්බකාය පටිසංවෙදී පස්සසිස්සාමීති
සික්ඛති පස්සම්භයං කායසංඛාරං අස්ස සිස්සාමීති
සික්ඛති පස්සම්භයං කායසංඛාරං පස්සසිස්සාමීති
සික්ඛති—

භික්ඛවෙ, මහණෙනි, භික්ඛු,(සංසාරෙ භයං ඉක්ඛතීති භික්ඛු යනුහෙයිං සසරභයදක්නා අර්ථයෙන් භික්ෂුනම්වූ යම්කිසි) යොගාවචරයෙක්තෙම; කායෙ, (කේසාදි දෙතිස්කුණු කොටසින්යුත් රූප) කයෙහි; කායානුපස්සී, කායගතාසති සිත්හි කරමින්; කථංවිහරති, කෙසේ වාසයකරන්නේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේශාසනයෙහි; භික්ඛු, (යථොක්ත අර්ථයෙ

Digitized by Google

ණ්) භික්ෂුනම්ලද හෙතෙම; අරඤ්ඤගතොවා; අරණ්‍යයකට ගියේහෝ; රුක්ඛමූලගතොවා (භාවනාවට සුදුසුවූ) වෘක්ෂ මූලයකට ගියේහෝ; සුඤ්ඤාගාරගතොවා, (එසේම භාවනානුරූපවූ ජනයන්ගෙන්) හිස්වතිබෙන ගෙයකට ගියේහෝ හෙතෙම; පල්ලඞ්කං ආභුජිත්වා, බද්ධපර්‍ය්‍යඞ්කයබැඳ; කායං, ශරීරය; උජුංපණිධාය, සෘජුකොට (අෂ්ටාදසප්‍රමාණවූ කොඳුඇටසනග්ගිනොනම් ඔවුනොවුන්කෙරෙහි පිහිටාතිබෙනසේ අවංකව) පිහිටුවාගෙණ; පරිමුඛංසතිං, (නිර්වාණසැපයෙහි සිහියඑලඹවා එමනිවන්ම අරමුණුකරමින්) සිහිය අභිමුඛකොට; උපට්ඨපෙත්වා, පිහිටුවාගෙණ; නිසීදති, හිඳිනේය; සො, (ඒ භාවනාවට නිසිලෙස මෙසේ සිහිය ඔබිනොබ යාගනාදී බැඳගෙණහුන්නාවූ) හෙතෙම; සතොව, සිහියෙන්ම; අස්සසති, ආශ්වාසය පවත්වන්නේය; සතොව, සිහියෙන්ම; පස්සසති, ප්‍රාශ්වාසයපැවැත්වීම කරන්නේය; දීඝංවා අස්සසන්තො, දීඝකොට ආශ්වාස කරන්නේහෝ; දීඝං අස්සසාමීති පජානාති, දීඝකොට ආශ්වාස කරන්නෙමි දන්නේය; දීඝංවා පස්සසන්තො, දීඝකොට ප්‍රාශ්වාස කරන්නේහෝ; දීඝං පස්සසාමීති පජානාති, දීඝකොට ප්‍රාශ්වාසය කරන්නෙමි දන්නේය;රස්සංවා අස්සසන්තො, ළුහුඬුකොට ආශ්වාස කරන්නේහෝ; රස්සංවා අස්සසාමීති පජානාති, ළුහුඬුකොට ආශ්වාසස කරන්නෙමි දන්නේය; රස්සංවා පස්සසන්තො, ළුහුඬුකොට ප්‍රාශ්වාසයකරන්නේහෝ; රස්සංපස්සසාමීති පජානාති, ළුහුඬුකොට ප්‍රාශ්වාසය කරන්නෙමි දන්නේය; සබ්බකාය, සියළු (ආශ්වාස ප්‍රාශ්වාස) කායයාගේ (උත්පත්තික්‍රමාදී සියළුප්‍රවෘත්තිය) පටිසංවෙදී, විශේෂයෙන් වැටහී (භාවනාකරණ තැනැත්තේ;) අස්සසිස්සාමීති, ආශ්වාසය පවත්වනෙමිසිතා; සික්ඛති, ආසේවනවසයෙන් අභ්‍යාසකරන්නේය; සබ්බකායං, (කියනලද ක්‍රමඇති) සියළු (ආශ්වාස ප්‍රාශ්වාස) කායයාගේ ප්‍රවෘත්තිය; පටිසංවෙදී විශේෂයෙන් ප්‍රකාශව වැටහීමෙන් නුවණැසින් දක්නා තැනැත්තේ; පස්සසිස්සාමීති, ප්‍රාශ්වාස කරන්නෙමිදැන; සික්ඛති, හික්මීමෙන් (අභ්‍යාශකරන්නේය;) කායසංඛාරං, (මහත් ඖලාරික) කායසංස්කාරය; පස්සම්භයං, සන්සිඳුවන්නේය (එසේසන්සිඳුවා වසනතැනැත්තේ;) අස්සසිස්සාමීති, ආශ්වාශ කරන්නෙම්දැන; සික්ඛති, හික්මීමෙන් අභ්‍යාසකරන්නේය; කායසංඛාරං, (මහත්වූ) කායසංස්කාරය; පස්සම්භයං, සංසිඳුවා වසනතැනැත්තේ; පස්සසිස්සාමීති, එසේ ප්‍රාශ්වාශකරන්නෙම්දැන; සික්ඛති, හික්මීමෙන් වාසයකරන්නේය; භි

Digitized by Google

ක්ඛවෙ, මහණෙනි; දක්ඛො, දක්‍ෂවූ; භමකාරොවා, භ්‍රමකා
රයෙක්හෝ; භමකාරන්තෙවාසීවා, භ්‍රමකාරයාගේ අතවැස්
සාහෝ; දීඝංවා අඤ්ඡන්තො, (දික්මහත් භාන්ඩයන් ලියනකා
ල හස්තපාදාදීන් දිගුකිරීමෙන්) දික්කොටඅදන්නේහෝ; දීඝං
අඤ්ඡාමීති, (මහත්භාඩ ලියනපිණිස) දික්කොට අදනෙමි
කියාද; රස්සංවා අඤ්ඡන්තො, ක්‍ෂුද්‍රභාඩ (ලියනපිණිස අත්පා
වක්කොට එහුඹුවහිද) අදන්නේහෝ; රස්සංඅඤ්ඡාමීති, එසේ,
එහුඹුකොට මදමදව අදනෙමිකියා; සෙය්‍යථාපි පජානාති,
හම්සේ දන්නේවේද; එවමෙවඛො, එපරිද්දෙන්ම වනාහි;
භික්ඛවෙ, මහණෙනි; භික්ඛු,(මේ ආනාපාණසති භාවනාවෙහි
යෙදීවසන) යෝගාවචර තෙම; දීඝංවා අස්සසන්තො, දික්
කොට ආශ්වාසකරන්නේ හෝ; දීඝං අස්සසාමීතිපජානාති,දික්
කොට ආශ්වාශ කරන්නෙමි දන්නේය; දීඝංවා පස්සසන්තො;
දික්කොට ප්‍රාශ්වාශ කරන්නේහෝ; දීඝං පස්සසිස්සාමීති
පජානාති, දික්කොට ප්‍රාශ්වාස කරන්නෙමිසිකියා දන්නේය;
රස්සංවා අස්සසන්තො, එහුඹුකොට ආශ්වාස කරන්නේහෝ;
රස්සං අස්සසාමීති පජානාති, එහුඹුකොට ආශ්වාස කරන්
නෙමිසි දන්නේය; සබ්බකායං, ආශ්වාස ප්‍රාශ්වාස කායයාගේ
(සියළුප්‍රවෘත්තිය;) පටිසංවෙදී, විශෙෂයෙන් වැටහී (භාවනා
කරණතැනැත්තේ;) අස්සසිස්සාමීති, ආශ්වාසපවත්නෙමිසිකි
නා, සික්ඛති, හික්ම (අභ්‍යාසකරන්නේය,) සබ්බකායං, සියළු
(ආශ්වාශ ප්‍රාශ්වාශ) කායයාගේ (ප්‍රවෘත්තිය); පටිසංවෙදී, (වි
ශෙෂයෙන් ප්‍රකාශව වැටහීමෙන්) නුවණැසින්දක්නා තැනැ
ත්තේ; පස්සසිස්සාමීති, ප්‍රාශ්වාශ කරන්නෙමිසිදැනැ; සික්ඛති,
හික්ම (මෙසේ අභ්‍යාසකරන්නේය;) කායසංඛාරං, (මහත්වූඖ
ලාරික) කායසංස්කාරය; පස්සම්භයං, සන්සිඳුවන්නේය(එසේ
සන්සිඳී වසනතැනැත්තේ;)අස්සසිස්සාමීති, ආශ්වාශ කරමිසිදැ
නැ; සික්ඛති, හික්මීමෙන් අභ්‍යාසකරන්නේය; කායසංඛාරං,
මහත්වූ කායසංස්කාරය; පස්සම්භයං, සන්සිඳීමෙන් වසනතැ
නැත්තේ; පස්සසිස්සාමීති, එසේ ප්‍රාශ්වාශ කරන්නෙමිදැනැ;
සික්ඛති, හික්මීමෙන් (මෙසේ ආනාපාණසති භාවනාවෙහි
යෙදී වාසය කරන්නේය—— මෙසේ [ආශ්වාස ප්‍රාශ්වාශග
ණන්ක්‍රම සිහිකිරීමය යනමේ ආනාපාණසති භාවනාවසයෙන්
කායානුපස්සනා සතිපට්ඨාන භාවනාවෙහි දක්වනලද ක්‍රම
යෙන්යෙදී වසන යෝගාවචරයාගේ බොහෝ දීර්ඝකාලයක්
මුළුලෙලහි රූපාදී නොයෙක් අරමුණුවල ව්‍යප්තවසිට සියළු
දුකට කාරණවූ පඤ්චකාමච්ඡන්දයම පුරුදුවීමෙන් දුර්වවූ කම්ම

Digitized by Google

සථානභාවනාමාර්ගයට බස්නටනොකැමැතිවූ අභිතවූ අකෘතඥවූ ඒසිත කුළුගොන්බැඳ අදනා රථයසම ඵාසුමාර්ගයෙන් පහව විෂමමාර්ගයට වදනාසේ අහිතවූ අඵාසුවට කාරණවූ අමාර්ගයෙහිම දිවන්නේය නොයෙක් නොයෙක්ජාතිවල ඒ ඒ පාප කර්මවල හැසිරීමෙන් පවුපුරා නොයෙක් ව්‍යසන පාප්තව බොහෝකාලයක් කායික චෛතසික දුඃඛාතුර සොචන ලක්‍ෂණවූ කුළුගොණකුවැනි නොහික්මුණු ඒ සිතනුවණැත්තන්විසින් නිශ්චලවනසේ දමනය කටයුත්තේය—යම්සේ කුළුදෙනෙකුගේකිරි පානයකොට වැඩුනු කුළුවස්සකු දමණයකරණුකැමති ගොපළුතෙම දෘඩවූ නොහික්මුණු ඒ කුළුවස්සා කුළුදෙන්කෙරෙන් වෙන්කොටගෙණ එක්පාර්ශවයෙහි වලක්කැණ මහත්ටැඹක් හිඳුවා එහි බලසහිත රැහැණකින්බඳිනලද කුළුවස්සා ඔබිනොබපැණ වැටී වෙහෙසීමෙන් රැහැණබිඳගෙණ අනික්තැනකට පලායන්ට නොහැකිව එමටැඹනිසාම හිඳිනේවේද— එපරිද්දෙන්ම බොහෝදීර්කාලයක් මුළුල්ලෙහි රූපාරම්මණාදි පචකාමවිෂනැමති රසයම අනුභවකිරීමෙන් වැඩෙනලද නුසුදුසු අරමුණටම තමා පෙරපුරුදුලෙස සුහුවදිවන සුළුවූ කුළුගොණකුවැනි නොහික්මුණු නපුරුචිත්තය දමණයකොට වැඩනි යොදනුකැමති භාවනා වෙහියෙදි වසන යෝගාවචරයාවිසින් රූපාදි ආරම්මණයන්කෙරෙන් දුරුව ශ්‍රද්ධාප්‍රඥාදි බලසහිතවූ ඒ සිහියනැමති රැහැණබිඳගෙණ ඒ ඒ තැන හැසිරීමට හිරිඔතප් නැමති ප්‍රාකාරයෙන් වටකොට යානොදී දමණයෙහිපිහිටුවා මේ.භාවනාවෙහියෙදි අප්‍රමාදව උත්සාහ කටයුත්තේය-

> ඉතිඅජ්ඣත්තංවා කායෙ කානුපස්සී විහරති, බහිද්ධාවා කායෙ කායානුපස්සීවිහරති අජ්ඣත්ත බහිද්ධාවා කායෙ කායානුපස්සීවිහරති සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති වයධම්මානුපස්සීවා කායස්මිංවිහරති සමුදය වයධම්මානුපස්සීවා කායස්මිං විහරති- අත්ථිකායොතිවාපනස්ස සතිපච්චුපට්ඨිතාහොති යාවදෙවඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතොචවිහරති නචකිඤ්චිලොකෙ උපාදියති එවම්පි භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති—

ඉති, මෙසේ, අජ්ඣත්තංවා, තමාගේහෝ; කායෙ, (ආශ්වාස ප්‍රාශ්වාස) කයෙහි; කායානුපස්සී විහරති, කායානුපස්සනා භාවනාව සිත්හිකරමින් (ආනිසංසවසයෙන් සලකාගෙණ) වාසයකරන්නේය; බහිද්ධාවා, අනුන්ගේහෝ; කායෙ, (ආශ්වා

Digitized by Google

ස ප්‍රාශ්වාස) කායෙහි, කායානුපස්සී විහරති, කායගතාසති කම්මට්ඨානය මෙනෙහිකරමින් වාසයකරන්නේය; අජ්ඣත්ත බහිද්ධාවා, (කියනලදක්‍රමයෙන්) ආධ්‍යාත්මිකවූහෝ; බාහ්‍යවූහෝ; කායෙ,(ආශ්වාස ප්‍රාශ්වාස)කායෙහි; කායානුපස්සී විහරති කායගතාසතිභාවනාව මෙනෙහිකරමින්(අප්‍රමාදව) වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, *(යම්සේ කම්මාරයින්ගේ කඹුරුසමය නලය ඊටකරණ ව්‍යායාමයයන කාරණානිසා වාතයබ්බිනොබ සම්සේහැසිරේද එපරිද්දෙම් මේභාවනාවෙහි යෙදුනු යොගාවචර භික්ෂූහුගේ ශරීරයද නාසාපුටයද චිත්තයදනිසා ආශ්වාස ප්‍රාශ්වාසයන්ගේ) උත්පත්ති ධම්මයන් දක්නේහෝ; කායස්මිං විහරති, (ආශ්වාස ප්‍රාශ්වාස) කායසිහි කරමින් වාසයකරන්නේය; වයධම්මානුපස්සීවා, (යථොක්ත ක්‍රමයෙන් ඔවුන්ගේ) විනාස ස්වභාව දක්නේහෝ; කායස්මිං විහරති, කය සිහිකරමින් වාසයකරන්නේය; සමුදයවය ධම්මානුපස්සීවා, කලෙක උත්පත්තිය කලෙකවිනාශය දන්නේහෝ; කායස්මිං විහරති, (ආශ්වාස ප්‍රාශ්වාස) කායයාගේ ඉපදීම නැසීම සිහිකරමින් වාසයකරන්නේය; අස්සපන, ඒ යෝගාවචරයාහට වනාහි; අත්ථිකායොති, ආශ්වාසප්‍රාශ්වාසය ඇත්තේය (සත්වපුද්ගලාදී කිසිවෙක් නැත්තේය) යි කියා; සතිපච්චුපට්ඨිතාහෙති, සිහිය පිහිටුවනලද්දේය; යාවදෙව, යම් සිහියක් එසේම නාකොට පිහිටුවන ලද්දේද ඒ සිහිය; ඤාණමත්තාය, (මතුමත්තෙහි) ඤාණයාගේ වෘද්ධිය පිණිසද; පතිස්සතිමත්තාය, ස්මෘතියයි කියනලද සිහියගේ වැඩීමපිණිසද; අනිස්සිතොච විහරති, (තෘෂ්ණා දෘෂ්ටියනමේ නිශ්‍රයන් දෙදෙනාගේ වසයෙන්දුරුව) අනිශ්‍රිතව වසන්නේය හෙවත් තෘෂ්ණාදෘෂ්ටි යන අකුසලයන් දෙදෙනාගෙන් දුරුව වාසය කරන්නේය (එහෙයින්;) ලොකෙ, සත්වලොකයෙහි; කිඤ්චි, කිසි රූපාදියක්; නචඋපාදියති, ආත්මාදි වසයෙන් වරදවා ගැන්මක් නොකරන්නේය, භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙම; එවම්පි, මෙසේද; කායෙ, ආශ්වාස ප්‍රාශ්වාස කායෙහි; කායානුපස්සී විහරති, කායගතාසති භාවනා සිහි කරමින් වාසයකරන්නේය——

——අනාපාන සතිකඩං——

මෙසේ ආශ්වාස ප්‍රාශ්වාසදෙදෙනාගේ ප්‍රවෘත්ති වසයෙන්

---

* කම්මාරයන්ගේ කඹුරුසමනම යකඩ තඹ පිත්තලාදීන් කම්මාන්ත කරන්නන්ගේ මයිනාසමයි.

Digitized by Google

ශරීරයාගේ ස්වභාව සිහිකරණ කායානුපස්සනා භාවනාව ප්‍රගුණකොට දක්වාවදාරා දැන් ගමනාදි ඊර්‍යාපථයෙහුදු දක්වනුපිණිස සුගත තථාගත සිවංකර චතුරොඝා ඵතරණ සේතුභූත අපහාස්‍යවත් බුදුරජාණන්වහන්සේ පුනචපරං යනාදීන් වදාල සේක——

(4) පුනචපරං භික්ඛවෙ භික්ඛු ගච්ඡන්තොවා ගච්ඡාමීති පජානාති ඨිතොවා ඨිතොම්හීති පජානාති නිසින්නොවා නිසින්නොම්හීති පජානාති සයානොවා සයානොම්හීති පජානාති යථා යථාවාපනස්ස කායො පණිහිතොහොති තථා තථානං පජානාති——

පුනචපරං, නැවතද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙම; ගච්ඡන්තොවා, යන්නේහෝ; ගච්ඡාමීති, යන්නෙමි කියා; පජානාති, දන්නේය; ඨිතොවා, සිටින්නේහෝ; ඨිතොම්හීති පජානාති, සිටින්නෙමියි දන්නේය; නිසින්නොවා, හුන්නේහෝ; නිසින්නොම්හීති පජානාති, හිඳිනෙමියි දන්නේය; සයානොවා, සයනයකරන්නේහෝ; සයානොම්හීති පජානාති, සයනයකරන්නෙමියි දන්නේය; අස්සපනකායො, ඔහුගේ කයවනාහී; යථා යථාවා, යම්යම් ඊර්‍යාපථයකින්; පණිහිතොහොති, පිහිටුවනලද්දද; තථා තථා, ඒ ඒ ප්‍රකාරයෙන්; නං, ඒ ඊර්‍යාපථය; පජානාති, දන්නේය——

ඉති අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී විහරති බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්ත බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති වයධම්මානුපස්සීවා කායස්මිං විහරති සමුදය වයධම්මානුපස්සීවා කායස්මිං විහරති——

ඉති, මෙසේ; අජ්ඣත්තංවා කායෙ, තමාගේ ශරීරයෙහිහෝ; කායානුපස්සී විහරති, (ගමනාදි ඒ ඒ ඊර්‍යාපථයන් අනුව සිතහැර) කයඅනුව බලමින් වාසය කරන්නේය; බහිද්ධාවා කායෙ, අනුන්ගේ ශරීරයෙහිහෝ; කායානුපස්සී විහරති, (ගමනාදි ඒ ඒ ඊර්‍යාපථයන් අනුවසිතහැර) කායගතාසති සිත්හිකරමින් වාසයකරන්නේය; අජ්ඣත්තබහිද්ධාවා කායෙ, තමාගේහෝ අනුන්ගේහෝ ශරීරයෙහි; කායානුපස්සී විහරති, (ගමනාදි ඒ ඒ ඊර්‍යාපථයන් අනුවසිතහැර) කායගතාසති සිත්හිකරමින් වාසයකරන්නේය; සමුදයවයධම්මානුපස්සීවා (ගමනාදි ඒ ඒ ඊර්‍යාපථයන්ගේ) උත්පත්ති ක්‍රම

විසින් දක්නේහෝ, කායසම්ං විහරති, (මේ ඊර්යාපථ කායයාගේ ස්වභාව සිහිකෙරෙමින්) කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය; වයධම්මානුපස්සීවා, (ඊර්යාපථයන්ගේ) විනාශක්‍රමවිසින් දක්නේහෝ; කායස්මිංවිහරති; කායානුපස්සනාවෙහි යෙදී වාසයකරන්නේය; සමුදය වයධම්මානුපස්සීවා චතුර්විධ ඊර්යාපථයන්ගේ) උත්පත්ති විනාසක්‍රම විසින් දක්නේහෝ; කායස්මිංවිහරති, කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය—

අත්ථිකායොති වාපනස්සසති පච්චුපට්ඨිතා හොති
යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සි
තොච විහරති නචකිඤ්චිලොකෙ උපාදියති එව
ම්පි භික්ඛවෙභික්ඛු කායෙ කායානුපස්සීවිහරති—

අස්සපන, (ඒ ඊර්යාපථානුස්මරණයෙහි යෙදීවසන) ඒ යෝගාවචරයාහට වනාහි; අත්ථිකායොති, (ඊර්යාපථවසයෙන් පවත්නා එම ඊර්යාපථ) කායඇත්තේය; (පරමාර්ථවසයෙන් සත්වපුද්ගලකෙනෙක් නැත්තේයයිකියා;) සතිපච්චුපට්ඨිතාහොති, සිහිය පිහිටුවන ලද්දේය; යාවදෙව, යම්සිහියෙක් එසේ මනාකොට පිහිටුවන ලදද ඒ සිහිය; ඤාණමත්තාය, ඤාණයාගේ වැඩීමපිණිසද; පතිස්සතිමත්තාය, සමෘතියගේ වැඩීමපිණිසද; අනිස්සිතොච විහරති, (තෘෂ්ණාදෘෂ්ටි යනමේ දෙදෙනාගෙන්) අනිශ්‍රිතව හෙවත් තෘෂ්ණාදෘෂ්ටියන අකුසලයන් දෙදෙනාගෙන් දුරුව වාසය කරන්නේය (එහෙයින් හෙතෙම;) ලොකෙ, මේ සත්වලෝකයෙහි; කිඤ්චි, කිසිරූපාදියක්; නචඋපාදියති, (ආත්මාදිවසයෙන්) වරදවා ගැන්මක් නැත්තේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භික්ෂුතෙම හෙවත් යෝගාවචර තෙම; එවම්පි, මෙසේදවනාහි; කායෙ, මේ ශරීරයෙහි; කායානුපස්සී විහරති, කායගතාසති භාවනාව සිත්හිකරමින් වාසය කරන්නේය—

——ඉරියාපථ කඩං——

මෙසේ ගමනාදි සතරඉරියව්වසයෙන් ශරීරයාගේ ස්වභාව සිහිකරණ කායානුපස්සනා භාවනාව විභාගකොට දක්වා වදාරා දූත් චතුසම්පජඤ්ඤ වසයෙනුදු දක්වනුපිණිස දේමා ති දේවවූ අප භාග්‍යවතුන් වහන්සේ පුනචපරං යනාදීන් වදාලසේක——

Digitized by Google

(5) පුනචපරං භික්ඛවෙ භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජාන කාරීහොති ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරීහොති සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති සංඝාටිපත්ත චීවරධාරණෙ සම්පජාන කාරීහොති අසිතෙපීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරීහොති උච්චාර පස්සාවකම්මෙ සම්පජාන කාරීහොති ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජාන කාරී හොති—

පුනචපරං, නැවතද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙම; අභික්කන්තෙ, ඉදිරියටයාමෙහිද; පටික්කන්තෙ, අපසුකරනැවීමෙහිද; සම්පජාන කාරීහොති, ප්‍රඥාවෙන්දැන පරමණීයකොට (සාවනොවූ කායසම්මතවූ ඇටසැකිල්ලෙක් ඉදිරියට යාමආදි ක්‍රියාකරන්නේයයි සලකාදැන) කරන්නේය, ආලොකිතෙ, අභිමුඛය බැලීමෙහිද; විලොකිතෙ, අනුදික් බැලීමෙහිද; සම්පජාන කාරීහොති, ප්‍රඥාවෙන්දැන මෙසේබලන්නේය; සමිඤ්ජිතෙ, හස්තපාදයන් හැකිලීමෙහිද; පසාරිතෙ, දිගුකිරීමෙහිද; සම්පජාන කාරීහොති, ප්‍රඥාවෙන්දැන (ඒ ඒ ප්‍රයොජනසලකා) කරන්නේය; සංඝාටිපත්තචීවරධාරණෙ, සංඝාටි පාසිවුරුදැරීමෙහිද; සම්පජාන කාරීහොති, (ධාතුසමූහයෙක් ධාතුසමූහයෙක්වැලඳගණී යනාදික්‍රමයෙන්)ප්‍රඥාවෙන්දැන සැලකීමෙන් වැලඳගන්නේය; අසිතෙ, අනුභවකිරීමෙහිද; පීතෙ, පානයකිරීමෙහිද; ඛායිතෙ, (ඛාද්‍යාදි විකෘතීන්ගේ) කෑමෙහිද; සායිතෙ, (මීසකුරු ආදීන්ගේ) රසවිඳීමෙහිද; සම්පජානකාරීහොති, නුවනින්දැන සලකා ප්‍රයෝජන විඳිනේය; උච්චාරපස්සාවකම්මෙ, (ශරීරයෙන්) මලමූ පහකිරීමෙහිද; සම්පජානකාරීහොති, ප්‍රඥාවෙන්දැන ආදීනවසලකා (ශරීරකිස) පවත්වන්නේය; ගතෙ, යාමෙහිද; ඨිතෙ, සිටීමෙහිද; නිසින්නෙ, හිඳීමෙහිද, සුත්තෙජාගරිතෙ, නිද්‍රාවකිරීමහා නිදිදුරුකිරීමෙහිද; තුණ්හීභාවෙ, කථානොකිරීමෙහිද; සම්පජානකාරීහොති, ප්‍රඥාවෙන්දැන ඒ කෘත්‍ය පවත්වන්නේය.

ඉති අජ්ඣත්තංවා කායෙ කායානුපස්සී විහරති බහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා කායෙ කායානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා කායස්මිං විහරති වයධම්මානුපස්සීවා කායස්මිං විහරති සමුදය වයධම්මානුපස්සීවා කායස්මිං විහරති—

Digitized by Google

ඉති, මෙසේ; අජ්ඣත්තංවා කායෙ, තමාගේ ශරීරයෙහි හෝ; කායානුපස්සී විහරති, (ඉදිරියට යාම්ආදි ඒ ඒ ක්‍රියාවන් අනුවසිතහැර ස්වලක්ෂණ විසින් සිහිකරණ) කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසයකරන්නේය; බහිද්ධාවා කායෙ, අනුන්ගේ ශරීරයෙහිහෝ; කායානුපස්සී විහරති, කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය; අජ්ඣත්තබහිද්ධාවායේ, තමාගේ හෝ අනුන්ගේ හෝ ශරීරයෙහි; කායානුපස්සී විහරති, කායානුපස්සනා භාවනායෙහි යෙදී වාසය කරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, (අභික්කමනාදි ඒ ඒ ක්‍රියාවන්ගේ) උත්පත්ති ක්‍රමය දක්නේහෝ; කායස්මිං විහරති, කායානුපස්සනා භාවනාවෙහියෙදී වාසයකරන්නේය; වයධම්මානුපස්සීවා, (ඉදිරියට යාම්ආදි ඒ ඒ ක්‍රියාවන්ගේ) විනාසයත් අනුවදක්නේ හෝ; කායස්මිං විහරති, කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසය කරන්නේය; සමුදය වය ධම්මානුපස්සීවා, (අභික්කමනාදි ඒ ඒක්‍රියාවන්ගේ) උත්පත්තිහා විනාසක්‍රම දක්නේහෝ; කායස්මිං විහරති, කායානුපස්සනා භාවනාවෙහි යෙදී වාසයකරන්නේය—

අත්ථි කායොති වා පනස්ස සතිපච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතොච විහරති නචකිඤ්චිලොකෙ උපාදියති එවම්පි භික්ඛවෙභික්ඛු කායෙ කායානුපස්සීවිහරති—

අස්සපන, (මෙසේ ඒ චතුසම්පජඤ්ඤ භාවනාවෙහි විභාග දන හැඳින එහි යෙදීවසන) ඒ යොගාවචරයාහට වනාහි; අත්ථිකායොති, (ඉදිරියටයාම ආදීවූ නොයෙක් ක්‍රියාපැවැත්විමය යනමේ) කයඇත්තේය (පරමාර්ථයෙන් සත්වපුද්ගල කෙනෙක් නැත්තේ) යයිකියා; සතිපච්චුපට්ඨිතාහොති, සිහිය පිහිටුවනලද්දේය; යාවදෙව, යම් ඒ සිහියෙක් එසේමණ කොට පිහිටුවන ලද්දේද ඒ සිහියවනාහි; ඤාණමත්තාය, මතුමත්තෙහි ඤාණයාගේ වෘද්ධියපිණිසද; පතිස්සතිමත්තාය, (සමෘතිසංඛ්‍යාත) සිහියගේ වැඩීමපිණිසද; අනිස්සිතොච විහරති, (තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනාගෙන්) දුරුව වාසයකරන්නේය; ලොකෙ, (කායසම්මතවූ) ශරීරලෝකයෙහි; කිඤ්චි, කිසි යාම්ඊම් ආදි ක්‍රියාවක්; නචඋපාදියති, ආත්මාදිවසයෙන් ගැන්මක් නොකරන්නේයි; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු; මහණතෙම; එවම්පි, මෙසේද; කායෙ, මේශරීරකයෙහි; කායානුපස්සීවිහරති, කායගතාසති භාවනාව සිත්හිකරමින් වාසයකරන්නේය—

Digitized by Google

චතුසම්පජඤ්ඤ කඩං

මෙසේ අභික්කමනාදිවූ චතුසම්පජඤ්ඤ වසයෙන් ශරීරයාගේ සවභාව සිහිකරණ කායානුපස්සනා භාවනාව විභාගකොට දක්වාවදාරා දැන් පටික්කූල මනසිකාර වසයෙනුදු දක්වනුපිණිස අප භාග්‍යවතුන් වහන්සේ පුනචපරං යනාදින් වදාළසේක.

(6) පුනචපරං භික්ඛවෙ භික්ඛු ඉමමෙවකායං උද්ධං පාදතලා අධොකෙස මත්ථකා තචපරියන්තං පූරං නානප්පකාරස්ස අසුචිනො පච්චවෙක්ඛති.

පුනචපරං, නැවතද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, මහණතෙම—නොහොත්-යෝගාවචරතෙම; උද්ධංපාදතලා, පාදතලයෙන්උඩ; අධොකෙසමත්ථකා, හිසකේ මස්තකයෙන් යට; තචපරියන්තං, සම කෙළවරකොටඇති; පූරං නානප්පකාරස්සඅසුචිනො, නානාවිධ අසූචින් පිරීසිටි; ඉමමෙවකායං, (කුණුකොටස්වූ ව්‍යාමමාත්‍රවූ) මෙම ශරීරයම; පච්චවෙක්ඛති, සිහිකරන්නේය.

හෙකෙසේද

අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු අට්ඨි අට්ඨිමිඤ්ජා වක්කං හදයං යකනං කිලොමකං පිහකං පප්ඵාසං අන්තං අන්තගුණං උදරියං කරීසං පිත්තං සෙම්හං පුබ්බො ලොහිතං සෙදො මෙදො අස්සුවසා ඛෙලො සිංඝා නිකාලසිකා මුත්තන්ති.

කෙසා, (හිස්වසාසිටි සමෙහි විඅගක්පමණ වැදසිටි) කේසයෝය; ලොමා, (අතුල් පතුල්හැර බොහෝසෙයින් සෙසුශරීරචර්මයෙහි ලෙහෙඩිපමණ වැදපිහිටියාවූ) ලෝමයෝය; නඛා, (මස්සම්බන්ධවූ තණ්හී තඹවන්වූ සෙසුතණ්හී සුදුවූ පිලීපොතුවැනි සටහන්ඇති ඇඟිලිඅගපිට පිහිටිවිසි) නියපොත්තෝය; දන්තා, (සුදුවර්ණවූ නොයෙක් සටහන්ඇති එක්මුල් දෙමුල් තුන්මුල් සිව්මුල් එකොන් දෙකොන් තුන්කොන් සිව්කොන්ඇති සම්පූර්ණ දත්ඇත්තහුගේ වසයෙන් දෙතිස්) දන්තයෝය; තචො, (කලු රත්වන්ආදි නොයෙක් වර්ණවූ යම්සිවියක් සියලුශරීරයෙන් පිඩුකරණලද්දී ඩෙබරඇටක්පමණවේද ඒසිවියෙන්යට පිහිටියාවූ සියලුශරීරයවසාසිටි සුදුවර්ණවූ)සමය; මංසං,(අතිරේක සහිතවූ තුන්සියයක්ඇට වසාසිටි කැලමල්වැනි නවසියයක්)මස්පිඩුය; නහාරු,උගුරෙ

හි මතුභාගයෙහිපටන් පෙරටුවෙත්ගියාවූ මහනහර පසක්ද
එසේමදකුණැලයෙත්ගියාවූ පසක්ද වම්ඇලයෙන්ගියාවූ පස
ක්ද පිටිපසින්ගියාවූපසක්ද දකුණත වැලදෙමින්පෙරටුවෙත්
හා පිටිපසින්ගියාවූමහනහරදසයක්ද එසේම වමතවැලෙදෙ
මින්ගියාවූමහනහරදසයක්ද දෙපයවැලඳගෙණ පෙරටුවෙන්
දපිටිපසින්දගියාවූ මහනහරවිස්සෙක්දැයි මෙසේ කැනහිලි ම
ල්කැකුළුබඳුසටහන්ඇති ශරීරයදරන්නාවූ මහනහරසැටක්ද,
ජීවවඩාසිටුම්වූ වරදූල්රැහැණට බඳුවූදකිඳිගුබඳුවූද· වීණාතත්
බඳුවූද, දලහුබඳුවූද, ඒඒප්‍රදෙශයෙහි පැතිරසිටිනහරද, අතුල්
පතුල්පිට පක්ෂිපාදබඳුනහරද හිසෙහි ලදරුවන් හිසපලඳනා
දූල්හුවැනි නහරද අව්වෙහිවනනලද මසුත්බඳනා දූලකට
බඳු පිටෙහි නහරද ශරීරයෙහි බහාලූ දූල්සැට්ටයක්බඳු ඒ ඒ
අඞ්ගප්‍රත්‍යඞ්ගගත නහරදැයි මෙසේ ගෙයකබැඳසිටි වැල්වෙ
න් සියළුශරීරයෙහි ඇටසැකිලිබැඳිසිටි සුදුවර්ණවූ නවසියය
ක්,)නහරය; අට්ඨි,(ශරීරයෙහි දෙතිස් දත්ඇට වෙන්කොට ග
ත්හෙයින් සෙසු සිව්සැටක්අත්ඇටද සිව්සැටක් පාඇටද)මාංස
නිශ්‍රිතවූ සිව්සැටක් මෘදුඇටද විලුම්ඇට දෙකද එකිඑකි පාද
යෙහි ගොප්ඇට දෙකද සීත්කකුලෙහි හෙවත් කෙන්ඩෙහි
ඇටදෙකද දනඇටයද කලවේ ඇටයද කටියෙහිඇටදෙකද
පිටකටුවෙහිඇටඅටලොසද පරාලඇටසූවිස්සද ලෙහිඇටතුදු
සද හදයඇටයද අකුඇටදෙකද පතුඇටදෙකද බාහුඇට දෙ
කද අතඅගඇට දෙකද උගුරෙහිඇට සතද හනුඇට දෙකද
නාසයෙහි ඇටයද හිස්කබල් නවයද මෙසේ තුන්සියයක්)
ඇටය; අට්ඨිමිඤ්ජා, (හුණනලක බහාලූ ඉදීගිය වේඅග බඩක්
ඩැතිසටහන්ඇති ඒ ඒ ඇටඇතුලෙහි පුරාසිටි සුදුවර්ණඇති)
ඇටමිදුළුය; වක්කං, (ගලවළුයෙන් නික්මුනු එක්මුලක් ඇති
මඳක්නැත්ගොස් දෙකක්වබෙදුනාවූ මහනහරින්බැඳී හෘදය
මාංශය වටකොට සිටියාවූ උරබඳුඇටක්වැනි වර්ණඇති එක
නටුවෙහිගත් අඹදෙකකටබඳු ආකාරඇති වකුගඩුනම්වූ එක්
වබැඳිසිටි) මස්පිඩුදෙකය; හදයං, (රත්පියුම්පෙතතක පිටබඳු
පැහැඇති යටබලාතුබූ නෙළුන්කැකුලකට බඳු ආකාරඇති
පිටතින් සිළුටුවූ ඇතුලත වැටකොළු එලයක ඇතුලවැනිවූ
නුවනැත්තන්ට මදක්පිපුනාවූ නුවනමදවුන්ට හැකුළුනාවූ
ඇතුලෙහි දෙඹඇටක් පිහිටනපමන වලක්ඇති යම්වලෙ
ක අඩපතක්පමන ලෙහෙසිටිද යම්ලෙයක් ආශ්‍රයකොට-
මනොධාතු මනො විඤ්ඤාණධාතු දෙදෙනාපවතිද්ද, රාගචරි
තයාහට රත්වර්ණවූ-වෙෂචරිතයා හට කළුවූ මොහචරිත

යාහට මස්දෙව් දියත්තක්බඳුවූ-විතක්ක චරිතයා හට කොල්ලූපුසබඳුවූ පැහැඇති-ශ්‍රද්ධාචරිතයාහට කිණිහිරිමලකටබඳු පැහැඇති-ප්‍රඥචරිතයාහට පිරිසිඳුකරණලද ජාතිරංග මාණික්‍යයක්මෙන් පැහැඳුනු සුදුවණීණවූ ඒ ලෙයදරා සිටින්නාවූ දෙතනමැදපිහිටි)හෘදය මාංසයද; යකනං,(මූලදීඑකක්ව අග දී දෙකක්වූ කොබලීල පතකටබඳු සටහන්ඇති තුවනමද වූත්වඑකක්වූ තුවනැත්තන්ට කුඩාවදෙකක්හෝ තුනක්හෝ වූ ඉතාරත්නොවූ මහනෙල්මලක පෙතිපිටබඳුවූ වණීඇති දෙතනමැද දකුනුපාශ්වයෙහි පිහිටි අක්මානත්වූ එක්ව බැඳිසිටි) මස්පටලදෙකය; කිලොමකං,(සුදු දුහුල්කඩකබඳු වණීඇති හෘදයද වකුගඩුවදවසාසිටියාවූ පටිච්ඡන්න දලඹුවදසිය එශරීරයෙහි සම්ංයට මාංසවැලඳගෙණසිටි අපටිච්ඡන්න දලඹු වදසියන පටිච්ඡන්න අපටිච්ඡන්නාවසයෙන් විප්‍රකාරවූ)දලඹුව යපිහකං,(නිකමලකටබඳුවණීඇති බොහෝසෙසිත්සතගුල් පමනාවූ කළුවස්සෙකුගේ දිවටබඳු සටහන්ඇති ආහුධපහරින් පිටතට නික්මුනුකලහි ජීවිතක්‍ෂයවන්නාවූ හදවතාවංපාශ්වයෙහි උදරපටලයාගේ මතුභාගයෙහි පිහිටියාවූ) බඩදිවය; පපඵාසං,නොසමකොටකැවූ මහත් පූකැබැල්ලකටබඳු සටහන් ඇති ඇතුලෙහි කැබිදෙයක් නැතිකල්හි නැගාවූ කම්මජ තේජස්හුගේ උනුසුමෙන් පහරණලදහෙයින් සපාහෙලූ පිඳුරුසපක්මෙන්නිරසවූ ඕජස්නැත්තාවූ ඉතා නොපැසුනු දිඹුල්ඵලයකටබඳු වණීඇති දෙතනඅතුරෙහි හදවතද අක්මාවද මත් තෙත්වසාගෙන එලෙමින් දෙතුන්කඩක්ව බෙදිසිටියාවූ)පපුසමය; අනතං,(හිස්වල්පත්නැති ඇලිගැරඩියෙකුටබඳු සටහන්ඇති මත්තෙත් ගලවලූයෙහිදපාත ගුදප්‍රදේශයෙහිද බැඳිසිටියහෙයින් ගලවළුවහා ගුදප්‍රදේශය කෙළවරකොටඇති. පුරුෂයන්ට දෙතිස්රියන් පමනවූ ස්ත්‍රීන්ට අටවිසිරියනක් පමනවූ එක්විසිතැනකින් නැමුනාවූ ශරීරඇතුලෙහි පිහිටි) අතුනුවැටිය හෙවත් බඩවැලය; අනතගුණං, (හෙල්මැලිමූලකටබඳු වණීඇති පාපිස්නා බිස්සෙහි දරණමඩුලල එපිට මෙපිට නොයනලෙස වෙලුරෙද්දක්මෙන් උදළු පොරොආදියෙන් කම්මාන්ත කරනනාවූන්ගේ අතුනුවැටිය ගිලියනොදීඑක්කොටබැඳි එක්විසි අතුනුවැටි අතුරෙහිසිටි) අනතගුණනම්වූ අතුනුබහනය; උදරියං, (පෙරහනෙහි සිපිලකොට බඳනාලද සහලටබඳු සටහන්ඇති උදරයෙහිවූ වැලඳූආහරයසි, උදරයනම් දෙඅතින්පෙලෙනලද තෙත්සළුවෙහිමැද නැගීඇතිවන අවකාසසංස්ථානයබඳුවූ අනතපටලයයසි එයපිටතින් සිළුවූය

ඇතුලත කුණුවගියකොස්කටුවෙක ඇතුලපිට බදුය යම් උද
රයෙක තක්කෝටනම් පණුවෝය ගණ්ඩුපාදනම් පණුවෝ
ය පටගුවැනි පණුවෝය හුවැනි පණුවෝයයි මේආදි දෙ
තිස්කුල ප්‍රභෙදඇති පණුවෝ ආකුලව්‍යාකුලව මූලුමූලුව හැ
සිරෙත්නාහු වෙසෙත්ද යම්පණුවෝවනාහී පානභෝජනා
දිය නැතිකල්හි පැණනැගී හෘදයමාංසයට පහරිත්ද පාන
භෝජනාදිය වලඳනකලද ඌර්ධ්වමුඛව පලමුකොට වැලඳූ
දෙතුන් ආලොපයක් ඝුහුවඝුහුව පැහැරගෙණකත්ද යමක් ඒ
පණුවත්ටවදන තිඹිරිගෙයවේද වැසිකිලියවේද ගිලන්හල
වේද අමුසොහොන්වේද යම් උදරපටලයෙක්හි පානභො
ජනාදිය වැටීතිබේද යම්සේ සැඩොල්ගම්දොරවූ ගවරවලට
ග්‍රීෂ්මකාලයෙහි දළපොදඇතිව වැසිවස්නාකල්හි දියෙන්
ගෙණයන මලමූත්‍ර සම් ඇට නහර කඩ කෙල මූකුනු ලෙහෙ
ආදිවූ නොයෙක් කුණුවැටී මඩදියෙන් හැලලී දෙතුන්දව
සක් ඇවෑමෙන් හටගත්තාවූ පණුකුලයන් ඇතිවූයේ සූර්‍ය්‍ය
රශ්මි වේගයෙන් කකියනලද්දේ මතුමතුයෙහි පෙනබුබුළු
නැගෙමින් ඉතා නිල්පැහැඇතිව අතිශයින් දුගඳ පිළිකුල්ව
එලබෙන්ටද දකින්වද නුසුදුසුබවට පැමිණසිටිතේද සිඹමද
ආශ්වාදකිරීමද කියනුකිම එපරිද්දෙන්ම නොයෙක් ප්‍රකාර
ඇති පානභොජනාදිය දත්නැමති මොහොලින් සුනුකරණ
ලද්දෙ දිව්නැමති අතින් පෙරලනලද්දේ දිවඅග කෙලහා
දිවමුල බොල්කෙලින්ද මිශ්‍රවනලද්දේ එකණෙහිම වර්ණගන්ධ
රස යනාදී සම්පත්පහවූයේ පේසකාරයන්ගේ බලිගා බල්ල
න්ගේ වමනයදවැනිව යම් උදරපටලයෙක්හි වැටී පිත් සෙම්
වාතයෙන් වැලදෙනලදුව ජඨරාග්නි සන්තාප වේගයෙන් කා
කාරණලද්දේ පනුවන්විසින් ආකුලව මතුමත්තෙහි පෙනබුබු
ළු නැගෙමින් ඉතා කුනුගඳ පිලිකුල්බවට පැමිනසිටීද යම්උද
රයක වැටුනාවූ පානභෝජනාදිය පස්පරිද්දකින් බෙදීමට පැ
මිණෙත්ද එක්භාගයක් පනුවෝකද්ද එක්භාගයක් ජඨරාග්නිය
දවාද එක්භාගයක් මූත්‍රබවටද එක්භාගයක් වච්චස්බවටද ඒ
ක් භාගයක් රසබවටද පැමින ලේමස්ආදින් වඩාද) ගේ උදර
නමැයි දතයුතු; කරීසං, (නාභියෙන්යටය පිටකටුවෙහි මූලය
යනමොවුන්ගේ අතරෙහි අතුනුකෙළවර උසින් අටඟුලක්
පමනවූ හුණනලක්වැනි යම්තැනෙක්හී යම්සේඋස්වූ භූමි
ප්‍රදේශයෙහි හුනූ වැසිදියගිලිහී පාත භූමිප්‍රදේශයපුරා සිටීද
එපරිද්දෙන්ම ආමාසයෙහි හුනුවාවූ යම්කිසි බත්පැන්ආදියක්
ඇද්ද ගේ උදරගිත්තෙන් පෙනනැගිනැගී පැසූතේ ගලෙ

Digitized by Google

* බුද්ධෙකංඛති-ධම්මෙ කංඛති-සංඝෙ කංඛති-සික්ඛාය කංඛති-පුබ්බන්තෙ කංඛති-අපරන්තෙ කංඛති-පුබ්බන්තාපරන්තෙකංඛති-ඉදප්පච්ච යතාපටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු කංඛති-යනඅටතැණ ඇද්දෝ නැද්දෝහොයි යනසැකය විචිකිච්ඡානම් වෙයි

විචිකිච්ඡාව; මෙ, මාගෙ; අජ්ඣත්තං විචිකිච්ඡං, ආධ්‍යාත්මිකවූ විචිකිච්ඡාව; අත්ථීති පජානාති, දුන්ඇතැයි දන්නේය; අසන්තංවා අජ්ඣත්තං, තමා කෙරෙහි අවිද්‍යමානවූ හෝ; විචිකිච්ඡං, (බුද්ධාදි අටතැණෙහි)සැකකිරීමයයි කියනලද විචිකිච්ඡාව; මෙ, මාගෙ, අජ්ඣත්තං විචිකිච්ඡං, ආධ්‍යාත්මිකවූ විචිකිච්ඡාව; නත්ථීති පජානාති, දුන්නැතැයි දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නාය විචිකිච්ඡාය; නූපන් විචිකිච්ඡාවගේ උප්පාදෙ,හොති, ඉපදීමවන්නේද; තංචපජානාති, ඒකාරණයද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නාය විචිකිච්ඡාය, උපන්නාවූ විචිකිච්ඡාවගේ; පහාණං හොති, (නුවණින් යෙදී කල්පනාකිරීම් ආදිකාරණා හේතුකොටගෙණ) දුරුවීමවන්නේද; තංචපජානාති, එදදන්නේය; යථාච, යම්කාරණයකින්; පහීණාය විචිකිච්ඡාය, ප්‍රහීණවූ විචිකිච්ඡාවගේ; ආයතිං, සෝවාන් මාර්ගයට පැමිණීමෙන් මත්තෙහි; අනුප්පාදෙ,හොති, ඉපදීමක් නොවේද; තංචපජානාති, ඒ කාරණයද දන්නේය—

ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති වය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති සමුදය වය ධම්මානු පස්සීවා ධම්මෙසු විහරති—අත්ථි ධම්මාතිවාපනස්ස සතිපච්චුපට්ඨිතාහොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතොච විහරති නචකිඤ්චිලොකෙ උපාදියති එවංඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති පඤ්චසුනීවරණෙසු—

ඉති, මෙසේ; අජ්ඣත්තංවා ධම්මෙසු, ආධ්‍යාත්මිකවූ පඤ්චනීවරණ ධර්මයන් කෙරෙහිහෝ; ධම්මානුපස්සී විහරති, නීවරණ ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; බහිද්ධාවා ධම්මෙසු, අනුන්පිළිබඳවපවත්නා නීවරණ ධර්මයන්කෙරෙහිහෝ; ධම්මානුපස්සී විහරති, (කාමච්ඡන්දාදී) නීවරණ ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; අජ්ඣත්ත බහිද්ධාවා ධම්මෙසු, ආධ්‍යාත්මිකවූද බාහිරවූද නීවරණ ධර්මයන්කෙරෙහි හෝ; ධම්මානුපස්සී විහරති, (කාමච්ඡන්ද ව්‍යාපාදාදී) නීවරණධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, ඒ

ඒ නීවරණධම්මයන්ගේ ඉපදීම්වසයෙන් දක්නේහෝ; ධම්මෙ
සු විහරති, ඒ ඒ නීවරණ ධම්මයන් අනුවබලමින් වාසයකර
න්නේය; වයධම්මානුපස්සීවා, එම නීවරණධම්මයන්ගේ නැතී
වීම් වසයෙන් දක්නේහෝ; ධම්මෙසුවිහරති, එම නීවරණ
ධම්මයන් අනුවබලමින් වාසයකරන්නේය; සමුදය ධම්මානු
පස්සීවා, (ඒ ඒ කාමච්ඡන්දාදි) නීවරණ ධම්මයන්ගේ කලෙ
කඉපදීම් කලෙකනැසීම් වසයෙන් දක්නේහෝ; ධම්මෙසුවි
හරති, (කාමච්ඡන්දාදි) නීවරණ ධම්මයන්ගේ ආදීනව වසයෙ
න් සිහිකිරීමෙන් ධම්මානුපස්සනා භාවනාවෙහියෙදී වාසය
කරන්නේය; අස්සපන, (ඒ ඒ නීවරණධම්මයන් අනුවබලමින්
භාවනාවෙහියෙදී වසන) ඒ යෝගාවචරයා හට වනාහි; අ
ත්ථි ධම්මාතිවා,(මෙසේවූ කාමච්ඡන්දාදි) නීවරණධම්මයෝ ඇ
ත්තාභූමයයි යන; සතිපච්චුපට්ඨිතාහොති, සිහිය මනාකොට
පිහිටුවනලද්දේය; යාවදෙව, මනාකොට පිහිටුවනලද ඒ සි
හිය; ඤාණමත්තාය, (මතුමත්තෙහි) ඤාණයාගේ වැඩීමපිණි
සද; පතිස්සතිමත්තාය, සිහියගේ වැඩීමපිණිසද; අනිස්සිතො
ච විහරති, (තෘෂ්ණායාගේ සංසාරෝත්පත්තියට කාරණාවූ කාම
ච්ඡන්දාදීන් කෙරෙන්) අනිශ්‍රිතව වාසය කරන්නේය; එහෙ
සින්—ලොකෙ, මේ නීවරණධම් ලෝකයෙහි; කිංචි, කිසි රූ
පාදියක්; නචඋපාදියති, මමය මාගෙයයිකියා ගැන්මක් නො
කරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භික්ෂුනම්වූ ඒ යෝ
ගාවචරතෙම; එවංඛො, මෙසේවනාහී; පඤ්චසුනීවරණෙසු,
ධම්මෙසු, ඒ පඤ්ච නීවරණධම්මයන් කෙරෙහි; ධම්මානුපස්සී වි
හරති, නීවරණධම්මයන්ගේ ස්වභාවාදී නවදෂිණයෙන් යෙදී
වාසය කරන්නේය—

——නීවරණ නිද්දෙසං——

මෙසෙ පඤ්චනීවරණ ධම්මයන්ගේ වසයෙන් ධම්මානුපස්ස
නා සතිපට්ඨාන භාවනාව විභාගකොට දක්වාවදාරා දැන් පඤ්ච
ස්කන්ධ ධම්මයන්ගේ වසයෙනුදු ප්‍රකාශකොට දක්වනුපිණිස
පරහිත නිරතවූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ පුනචපරං
යනාදීන් වදාළසේක—

(20) පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසුධම්මානුපස්සී වි
හරති පඤ්චසුපාදානක්ඛන්ධෙසු කථංචභික්ඛවෙ භික්ඛු
ධම්මෙසු ධම්මානුපස්සීවිහරති පඤ්චසුපාදානක්ඛන්ධෙ
සු ඉධභික්ඛවෙභික්ඛු ඉතිරූපං ඉතිරූපස්ස සමුදයො
ඉති රූපස්ස අත්ථගමො ඉතිවෙදනා ඉති වෙදනාය

Digitized by Google

සමුදයො ඉති වෙදනාය අත්ථගමො ඉති සඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයො ඉති සඤ්ඤාය අත්ථගමො ඉති සංඛාරා ඉති සංඛාරානං සමුදයො ඉති සංඛාරානං අත්ථගමො ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථගමො—

භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භාවනානුයෝග භික්ෂුතෙම; පුනචපරං, නැවතද; පඤ්චසුපාදානක්ඛන්ධෙසු ධම්මෙසු, රූපස්කන්ධාදි පඤ්චවිධ උපාදානස්කන්ධ ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී විහරති, ධම්මානුපස්සනා කම්මට්ඨානයන් මෙනෙහිකරමින් වාසයකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භාවනාවෙහියෙදී වාසයකරණ භික්ෂුතෙම; පඤ්චසුපාදානක්ඛන්ධෙසු ධම්මෙසු, රූපස්කන්ධාදි පඤ්චවිධ උපාදානස්කන්ධධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ඒ ඒ ස්කන්ධයන් අනුව සිතහැරබලමින්; කථංච විහරති, කෙසේ වාසයකරන්නේද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භික්ෂුතෙම; ඉධ, මේශාසනයෙහි; ඉති රූපං, (අතීතානාගත පච්චුප්පන්න අජ්ඣත්තික බාහිර ඕලාරික සුඛුමදූර සන්තික හීනප්පනීතයන මේ එකොලොස්තැන්හිසිටි භූතොපාද භේදයෙන් අටවිසිවිධවූ විකාරවීමයයන රූප්පනාර්ථයෙන් රූපනම්වූ මේරූපය මෙතෙකැයි මෙයින්පිටත් රූපයෝ නැතැයිකියා) රූපයාගේ ඇතිස්වභාවහෙයින් දන්නේය; ඉතිරූපස්ස සමුදයො, අවිද්‍යාදි සමුදයන්ගේ පංචප්‍රකාර රූපතෘෂ්ණාවද; ඉතිරූපස්ස අත්ථගමො, (අවිද්‍යා නිරෝධාදිවසයෙන් පංචප්‍රකාරවූ)රූපයාගේ අස්තංගමයද දන්නේය; ඉතිවෙදනා, [එම එකොලොස්තැන්හි සිටියාවූ රූපයන්නිසා පවත්නාවූ චතුභූමික සුඛදුක්ඛ උපෙක්ෂායයි කියනලද වෙදනාත්‍රය වන්නේය මෙයින්පිටත් වේදනාවෝ නැතැයිකියා] වේදනාවන්ගේ ඇතිස්වභාව වසයෙන් දන්නේය; ඉතිවෙදනායසමුදයො, අවිද්‍යාදි සමුදයන් පඤ්චප්‍රකාර වෙදනා තෘෂ්ණාවද; ඉතිවෙදනාය අත්ථගමො, අවිද්‍යා නිරෝධාදි වසයෙන් වේදනාවන්ගේ අස්තංගමයද දන්නේය; ඉතිසඤ්ඤා, [එම එකොලොස්තැන්හිම සිටි රූපසංඥාදි භේදඇති සතරභූමියෙහි පවත්නා නීලවර්ණාදීන් හැඳිනීම ලක්ෂණකොටඇති මේ සංඥා මෙතෙකැයි මෙයින්පිටත් සංඥා නැතැයිකියා] ඇති ස්වභාවයෙන් දන්නේය; ඉතිසඤ්ඤාය සමුදයො, අවිද්‍යාදීන්ගේ පහලවීමෙන් උපදනා පඤ්චප්‍රකාරවූ සංඥා තෘෂ්ණාවද; ඉති සඤ්ඤාය අත්ථගමො, [අවිද්‍යා නිරෝධ වසයෙන් පඤ්චප්‍රකාරවූ] සංඥාවන්ගේ අස්තංගමයද වන්නේයයි දන්නේය; ඉතිසං

ඛාර, [එම එකොලොස් තන්හිම පැවති සතරභූමියෙහි
ඇතුලත්වූ කුසලාදි නොයෙක් භේදඇති චෙතනානම්වූ මේ
සංඛාරයො මෙතෙකැයි මෙයින්පිටත් සංඛාරණම්ලද] කුස
ලා කුසල චේතනාවෝ නැතැයිකියා සබ්භාවහෙයින් දන්
නේය; ඉතිසංඛාරානං සමුදයො, අවිජ්ජාදි හේතුධම්මයන්ගේ
උපදනා පඤ්චප්‍රකාරවූ සංඛාර තෘෂ්ණාවද; ඉතිසංඛාරානං අත්ථ
ගමො, අවිජ්ජාදීන්ගේ නැතිවීම්වසයෙන්වූ පඤ්චප්‍රකාරසංඛාරය
න්ගේ අස්තංගමයද වන්නේයයි දන්නේය; ඉතිවිඤ්ඤාණං,
[එම එකොලොස්තන්හි සිටියාවූ සතරභූමියෙහි පැවති ච
ක්ඛුවිඤ්ඤාණ වසයෙන් නොයෙක් භෙදඇති] මේ විඤ්ඤාණ
මෙතෙකැයි මෙයින්පිටත් විඤ්ඤාණනැතැයිකියා ඇතිසබ්භා
වයෙන් දන්නේය; ඉතිවිඤ්ඤාණස්ස සමුදයො, අවිජ්ජාදි සමුද
යන්ගේ පඤ්චප්‍රකාර විඤ්ඤාණ තෘෂ්ණාවද; ඉතිවිඤ්ඤාණස්ස
අත්ථගමො, අවිජ්ජානිරොධාදි වසයෙන් පඤ්චප්‍රකාරවූ විඤ්ඤාණ
යාගේ අස්තංගමයද දන්නේය—

ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති
බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති අජ්ඣත්ත
බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති සමුදය
ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති වය ධම්මානුප
ස්සීවා ධම්මෙසු විහරති සමුදය වය ධම්මානුපස්සී
වා ධම්මෙසු විහරති—අත්ථි ධම්මාති වාපනස්ස සති
පච්චුපට්ඨිතා හොති යාවදෙව ඤාණමත්තාය පති
ස්සතිමත්තාය අනිස්සිතොව විහරති නචකිඤ්චිලො
කෙ උපාදියති එවංඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු
ධම්මානුපස්සී විහරති පඤ්චුපාදානක්ඛන්ධෙසු—

ඉති, මෙසේ; අජ්ඣත්තංවා ධම්මෙසු, අධ්‍යාත්මිකවූ හෝ
තමාකෙරෙහි ඇත්තාමවූ රූපස්කන්ධාදිවූ පඤ්චස්කන්ධ ධම්ම
යන්කෙරෙහි; ධම්මානුපස්සී විහරති, (රාසිඅර්ථයෙන් ඛන්ධ
නම්වූ) ඒ ඒ ස්කන්ධයන් අනුව නුවණැසමෙහෙයා බලමින්
වාසය කරන්නේය; බහිද්ධාවා ධම්මෙසු, බාහිරවූ තමාකෙරෙ
න් පිටත් සෙසු පඤ්චස්කන්ධ ධම්මයන්කෙරෙහි; ධම්මානුපස්සී
විහරති, ඒ ඒ ස්කන්ධධම්මයන් අනුවබලමින් වාසයකරන්
නේය; අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු, තමාකෙරෙහි හෝ අ
නුන්කෙරෙහි හෝ විද්‍යමානව පවත්නා ස්කන්ධ ධම්මයන්
කෙරෙහි, ධම්මානුපස්සී විහරති, ඒ ඒ ස්කන්ධධම්මයන් අනු
වබලමින් වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, රූපාදි

Digitized by Google

කන්ධ ධම්මයන්ගේ උත්පත්ති ක්‍රම විසින් දන්නේ හෝ; ධම්මෙසු විහරති, රූපස්කන්ධාදි ධර්මයන් අනුව බලමින් වාසයකරන්නේය; සමුදය වය ධම්මානුපස්සීවා, එම ස්කන්ධ ධර්මයන්ගේ උත්පත්ති විනාසක්‍රම අනුව නුවණැස මෙහෙයා දක්නේහෝ; ධම්මෙසුවිහරති, ස්කන්ධධර්මයන් අනුවබලමින් භාවනාවෙහියෙදී වාසයකරන්නේය;–අස්සපන, (මෙසේ රූපාදි ස්කන්ධයන් අනුව නුවණැසින් බලමින්වසන) ඒ යෝගාවචරයාහට වනාහි, අත්ථිධම්මාතිවා, මෙසේ ස්කන්ධ ධර්මයෝ ඇත්තාහු මයයියන; සතිපච්චුපට්ඨිතා හොති, සිහිය පිහිටුවන ලද්දේය; යාවදෙව, යම්සිහියෙක් එසේමනාකොට පිහිටුවන ලදද ඒ සිහිය; ඤාණමත්තාය, මතුමත්තෙහි ඤාණයාගේ වැඩිමපිණිසද; පතිස්සති මත්තාය, සිහියගේ වැඩිමපිණිසද, අනිස්සිතොච විහරති, (සත්වයාගේ උත්පත්තියට කාරණාවූ තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනාකෙරෙන් දුරුව) අනිශ්‍රිතව වාසයකරන්නේය; එහෙයින්—ලොකෙ, (ආධ්‍යාත්මික බාහිරවූ නොයෙක් ප්‍රභේදඇති මේ) පඤ්චස්කන්ධ ලෝකයෙහි; කිඤ්චි, කිසිරූපාදියක්; නවඋපාදියති, මමය මාගේයයි කියා මෝහයෙන් මුලාව ගැන්මක් නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, යෝගාවචර භික්ෂුතෙම; එවංඛො, මෙසේවනාහි; පඤ්චසුපාදානක්ඛන්ධෙසු ධම්මෙසු, රූපස්කන්ධාදි ධර්මලෝකයන් කෙරෙහි; ධම්මානුපස්සී විහරති, ස්කන්ධ ධර්මයන්ගේ ස්වභාවාදි නවදර්ශනයෙන් යෙදී වාසයකරන්නේය—

—ඛන්ධ නිද්දෙසං—

මෙසේ පඤ්චස්කන්ධාදි වසයෙන් ධම්මානුපස්සනා භාවනාව විභාගකොට දක්වාවදාළ දූත් ආයතනයන්ගේ වසයෙනුදු ප්‍රකාශකොට දක්වනුපිණිස බ්‍රහ්මාමරනර නාගාදි අශේෂජන චක්ෂූනිය්‍ය භාග්‍යවත් බුදුරජානන්වහන්සේ පුනචපරං යනාදින් වදාළසේක—

(21) පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුඤ්ච පජානාති රූපෙච පජානාති යඤ්ච තදුභයං පටිච්ච උප්පජ්ජති සංයොජනං තඤ්ච පජා

Digitized by Google

නාති යථාච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පා
දොහොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සඤ්
ඤොජනස්ස පහාණංහොති තඤ්චපජානාති යථාචප
හීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදොහොති
තඤ්චපජානාති—

භික්ඛවෙ, මහණෙනි; පුනචපරං, නැවතද; භික්ඛු, යෝ
ගාවචර භික්ෂුතෙම; ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙ
සු ධම්මෙසු, චක්ෂුරාදි ආධ්‍යාත්මිකවූ ෂට්ආයතනයන්ද රූප
ශබ්දාදි බාහිරවූ ෂට්ආයතනයන්ද යනමේ ද්වාදශායතන ධ
ර්මයන්කෙරෙහි, ධම්මානුපස්සී, චක්ෂුරාදි ඒ ඒ ධර්මයන්අනු
ව සිතහැර (ඔවුනොවුන්ගේ විද්‍යමාන ස්වභාවසයෙන් මෙ
නෙහිකරමින්;) විහරති, වාසයකරන්නේය; භික්ඛවෙ, මහ
ණෙනි; භික්ඛු, (කමටහන්හි යෙදිවසන) භික්ෂුතෙම; ඡසු
අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු ධම්මෙසු, ආධ්‍යාත්මික
බාහිරවූ මේ ද්වාදශායතන ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී,
ඒ ඒ ධර්මයන් අනුවබලමින්; කථංචවිහරති, කෙසේ වාසයක
රන්නේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේ ශාසනයෙහි;
භික්ඛු, ධම්මානුපස්සනා කර්මස්ථානයෙහි යෙදිවසන භික්ෂු
තෙම; චක්ඛුංච, (ඉතාදුරවූද රූපාදි අරමුණුගන්නාවූ) චක්ෂු
සද; පජානාති, යථාස්වභාවයෙන් දන්නේය; රූපෙච, (විකාර
යට පැමිණවීම ස්වභාවකොට ඇති චක්ෂුවට ගොචරවූ) රූප
යද; පජානාති, යථාස්වභා වසයෙන් දන්නේය, තදුභයං පටි
ච්ච, ඔවුනොවුන්ට විෂයවූ චක්ෂු රූපයන දෙදෙනාගේ එක්
වීම හේතුකොටගෙණ (යහපත් ඉෂ්ටා රම්මණවූ යම්රූපයක්
දැක එහි ලෝභඋපදවා කාමාස්වාද වසයෙන් ආස්වාදකරන්
නාහට උපදනා කාමරාග සංයෝජනයද අප්‍රියවූ අනිෂ්ටා
රම්මණ රූපයෙහි නොසතුටුව සිතගැටීමෙන් කිපෙන්නා
හට උපදනා පටිඝසං යෝජනයද—මාහැර අනික්කවරෙක්
මේ රූපාරම්මණය වඩන්නට සමර්ථවන්නෙහි දැයි සිතන්නා
හට උපදනා මාණසංයෝජනයද—මේ රූපාරම්මණය නි
ත්‍යය ස්ථිරයයි ගන්නාහට උපදනාදිට්ඨි සංයෝජනයද—මේ
රූපාරම්මණය සත්වයෙක්ද නොවේදැයිකියා රූපයෙහි සැක
සිතන්නාහට උපදනා විචිකිච්ඡා සංයෝජනයද—මතු භව
යෙහි උපදනාමට මේ රූපදර්ශණය මෙසේම සුලභවූයේනම්
ඉතායෙහෙකැයි සිතන්නාහට භවයම පැතීමෙන් උපදනා
භව රාග සංයෝජනයද—මත්තෙහිද මේ රූපස්වභාවයාගේ

Digitized by Google

ප්‍රතිලාභයසීලවෘත සමාදානයනිසා ලබත්වහැකියයි සිතාසීල
වෘත සමාදානයෙහි යෙදෙන්නාහට උපදනා සීලබ්බත පරා
මාස සංයෝජනයද—මේ රූපදක්‍ෂිණය අනිකෙක් නොලද
හොත් ඉතායෙහෙකැයි සිතන්නාහට උපදනා ඉස්සාසංයෝ
ජනයද—තමාවිසින් දක්‍ෂිණාසවාදලත් රූපාරම්මණය අනික
ක්හට දක්‍ෂිණයට අවකාශනොදී මසුරුකරන්නාහට උපදනා
මච්ඡරිය සංයෝජනයද—සර්වාකාරයෙන්ම සහජාත අඥාණ
වසයෙන් උපදනා අවිද්‍යා සංයෝජනයද—යනමේ දශවිධ සං
යෝජනයන් කෙරෙන්;) යඤ්චසඤ්ඤොජනං උප්පජ්ජති, යම්කි
සි සංයෝජනකෙනෙක් උපදනේද; තඤ්චපජානාති, හෙදදන්
නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස සඤ්ඤොජ
නස්ස, නූපන් සංයෝජනයාගේ; උප්පාදො හොති, ඉපදීමවේ
ද; තඤ්චපජානාති, හෙදදන්නේය; යථාච, යම්කාරණයකින්;
උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපං සංයෝජනයාගේ; පහා
ණංහොති, තදඞ්ග විෂ්කම්භනාදී වසයෙන් ප්‍රහාණියවේද;
තඤ්චපජානාති, හෙදදන්නේය; යථාච, යම්කාරණයකින්; ප
හීණස්ස සඤ්ඤොජනස්ස, සමුච්ඡෙද ප්‍රහාණියෙන් දුරුවූ සං
යෝජනයාගේ; ආයතිං අනුප්පාදො හොති, (සෝවාන්ආදී මා
ර්ගවලට පැමිණීමෙන්) මත්තෙහි ඒ ඒ සංයෝජනයන්ගේ
ඉපදීමක් නොවේද; තඤ්චපජානාති, හෙද දන්නේය—

> සොතඤ්ච පජානාති සද්දෙච පජානාති යඤ්ච තදුභයං
> පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්ච පජානාති යථා
> ච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදො හොති
> තඤ්ච පජානාති යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස
> පහාණං හොති තඤ්ච පජානාති යථාච පහීණස්ස ස
> ඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්ච පජා
> නාති—

සොතඤ්ච, (ශබ්දශ්‍රවණයට විෂයවූ) ශ්‍රොත්‍රයද; පජානාති;
යථාස්වභාවයෙන් දන්නේය; සද්දෙච, (ශ්‍රොත්‍රවිඥෙයයවූ)
ශබ්දයද; පජානාති, ස්වලක්‍ෂණවසයෙන් දන්නේය; තදුභ
යංපටිච්ච, ශ්‍රොත්‍රශබ්දයන මේ දෙදෙනාගේ එක්වීම හේතු
කොටගෙණ ඔවුන්ගේම සමවායෙන්; යඤ්චසඤ්ඤොජනං උප්ප
ජ්ජති, (කියනලද ඒ දශවිධ සංයෝජනයං කෙරෙන්) එක්
තරා සංයෝජන කෙනෙක් උපදනේද; තඤ්චපජානාති, හෙද
දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස සඤ්ඤො

Digitized by Google

ජනස්ස; නූපන් සංයෝජනයාගේ; උප්පාදොහොති, ඉපදීම
වේද; තඤ්චපජානාති, හෙදදන්නේය; යථාච, යම්කාරණයකි
න්; උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපන්නාවූ සංයෝජනයා
ගේ; පහාණංහොති, ප්‍රහාණීයවේද; තඤ්චපජානාති, හෙද ද
න්නේය; යථාච, යම්කාරණයකින්; පහීණස්ස සඤ්ඤොජ
නස්ස, (සමුච්ඡෙද ප්‍රහාණියෙන්) දුරුවූ සංයෝජනයාගේ;
ආයතිං අනුප්පාදොහොති, සොවාන්ආදි මාර්ගවලට පැමිණී
මෙන් මත්තෙහි ඉපදීමක්නොවේද; තඤ්චපජානාති, හෙද
දන්නේවේ—

ඝාණඤ්ච පජානාති ගන්ධෙච පජානාති යඤ්චතදුභයං
පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්චපජානාති යථා
ච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදොහොති
තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස
පහාණංහොති තඤ්චපජානාති යථාච පහීණස්ස ස
ඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදොහොති තඤ්චපජා
නාති—

ඝාණඤ්ච, (සුගඳ දුගඳ ආඝ්‍රාණය කරන්නාවූ) නාසයද; පජා
නාති, ස්වලක්ෂණවසයෙන් දන්නේය; ගන්ධෙච, (ඝාණවි
ඤ්ඤෙය්‍යවූ) ගන්ධයද; පජානාති, (ඒ ඒ ස්වභාවසයෙන්) දන්
නේය; තදුභයං පටිච්ච, (ඔවුනොවුන්ට විෂයවූ ඝ්‍රාණගන්ධ
යන) ඒ දෙදෙනාගේ එක්වීම හේතුකොටගෙණ, යඤ්චසඤ්
ඤොජනං උප්පජ්ජති, (ඒ දශවිධ සංයෝජනයන් කෙරෙන්)
යම් එක්තරසංයෝජනකෙනෙක් උපදනේද; තඤ්චපජානාති,
එදදන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස ස
ඤ්ඤොජනස්ස, නූපන් සංයෝජනයාගේ; උප්පාදොහොති,
ඉපදීමවේද; තඤ්චපජානාති, එදදන්නේය; යථාච, යම්කාර
ණයකින්; උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපන්නාවූ සංයෝ
ජනයාගේ; පහාණංහොති, (තදඞ්ග වික්ඛම්භනාදි වසයෙන්)
ප්‍රහාණීයවේද; තඤ්චපජානාති, එදදන්නේය; යථාච, යම්කා
රණයකින්; පහීණස්ස සඤ්ඤොජනස්ස, (සමුච්ඡෙද ප්‍රහාණී
යෙන්) ප්‍රහීණවූ සංයෝජනයාගේ; ආයතිං අනුප්පාදොහො
ති, (සෝවාන්ආදි මාර්ගවලට පැමිණීමෙන්) මත්තෙහි ඉපදී
මක් නොවේද; තඤ්චපජානාති, එද දන්නේය—

Digitized by Google

ජිව්හඤ්ච පජානාති රසෙච පජානාති යඤ්චතදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්චපජානාති යථාච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදො හොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහාණංහොති තඤ්චපජානාති යථාච පහීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්චපජානාති—'

ජිව්හඤ්ච, (සියළුආහාරරස සේවනයකරන්නාවූ) දිවද; පජානාති, ස්වලක්ෂණ වසයෙන් දන්නේය; රසෙච, (ජිව්හා විඥෙයයවූ) රසයද; පජානාති, (එසේම) දන්නේය; තදුභයං පටිච්ච, (ඔවුනොවුන්ට විෂයවූ ජිව්හාය රසයයන) ඒ දෙදෙනාගේ එක්වීම හේතුකොට ගෙණ; යඤ්චසඤ්ඤොජනං උප්පජ්ජති, (ඒ දශවිධ සංයෝජනයන් කෙරෙන්) යං ඒ එක්තරා සංයෝජනකෙනෙක් උපදනේද; තඤ්ච පජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස, නූපන් සංයෝජනයාගේ; උප්පාදොහොති, ඉපදීම වේද; තඤ්චපජානාති, එදදන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපන්නාවූ සංයෝජනයාගේ; පහාණංහොති, ප්‍රහාණීයවේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; පහීණස්ස සඤ්ඤොජනස්ස, (සමුච්ඡෙද ප්‍රහාණියෙන්] ප්‍රහීණවූ සංයෝජනයාගේ; ආයතිං අනුප්පාදොහොති, (මාර්ගඵලාදියට පැමිණීමෙන්) මත්තෙහි ඉපදීමක් නොවේද; තඤ්චපජාති, එද දන්නේය—

කායඤ්චපජානාති ඵොට්ඨබ්බෙච පජානාති යඤ්චතදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්චපජානාති යථාච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදො හොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහාණංහොති තඤ්චපජානාති යථාච පහීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදොහොති තඤ්චපජානාති—

කායඤ්ච, (කුච්ඡිතානං සාසවධම්මානං ආයොතිකායො යන්නු බැවින් කුත්සිත නින්දිත පාපධර්මයන්ටද කේසාදි කුනපයන්ටද උත්පත්තිස්ථාන බැවින්) කායනම්වූ ශරීරයද; පජානාති, යථාස්වභාවයෙන් දන්නේය; ඵොට්ඨබ්බෙච, (කායවිඥෙයය වූ) ස්පර්ශයද; පජානාති, එසේමදන්නේය; තදුභයං පටිච්ච,

[බවුනොවූත්ට විෂයවූ ශරීර ස්පර්ශයන] ඒ දෙදෙනාගේ එක්වීම හේතුකොටගෙන, යඤ්චසඤ්ඤොජනං උප්පජ්ජති, (ඒ දශවිධ සංයෝජනයන් කෙරෙන්] එක්තරා සංයෝජනයකෙනෙක් උපදනේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම් කාරණයකින්; අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස, නූපන් සංයෝජනයාගේ; උප්පාදො හොති, ඉපදීමවේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපන්නාවූ සංයෝජනයාගේ; පහාණංහොති; ප්‍රහාණීයවේද; තඤ්චපජානාති, එදදන්නේය; යථාච, යම් කාරණයකින්; පහීණස්ස සඤ්ඤොජනස්ස, (සමුච්ඡෙද ප්‍රහාණියෙන්] දුරුවූ සංයෝජනයාගේ; ආයතිං අනුප්පාදො හොති, [මාර්ගඵලාදියට පැමිණීමෙන්] මත්තෙහි ඉපදීමක් නොවේද; තඤ්චපජානාති, එදදන්නේය—

> මනඤ්චපජානාති ධම්මෙච පජානාති යඤ්චතදුභයං පටිච්ච උප්පජ්ජති සඤ්ඤොජනං තඤ්චපජානාති යථාච අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස උප්පාදො හොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සඤ්ඤොජනස්ස පහාණංහොති තඤ්චපජානාති යථාච පහීණස්ස සඤ්ඤොජනස්ස ආයතිං අනුප්පාදො හොති තඤ්චපජානාති—

මනඤ්ච, [රූපාදි නොයෙක් අරමුණු වෙන් වෙන්කොට සලකන] චිත්තයද; පජානාති, ස්වලක්ෂණවසයෙන් දන්නේය; ධම්මෙච, [මනො විඤ්ඤාණයවූ රූපාරූප] ධර්මයන්ද; පජානාති, එසේම දන්නේය; [තදුභයං පටිච්ච, (මනොයන චිත්තයට ගෝචරවූ රූපාරූප ධර්මයන] මොවුන්දෙදෙනාගේ එක්වීම හේතුකොටගෙන; යඤ්චසඤ්ඤොජනං උප්පජ්ජති, [ඒ දශවිධ සංයෝජනයන් කෙරෙන්] යං ඒ එක්තරා සංයෝජනකෙනෙක් උපදනේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස සඤ්ඤොජනස්ස, නූපන් සංයෝජනයාගේ; උප්පාදො හොති, ඉපදීමවේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස සඤ්ඤොජනස්ස, උපන්නාවූ සංයෝජනයාගේ; පහාණංහොති, ප්‍රහාණීයවේද; තඤ්චපජානාති, එද දන්නේය; යථාච, යම්කාරණයකින්; පහීණස්ස සඤ්ඤොජනස්ස, [සමුච්ඡෙද ප්‍රහාණියෙන්] දුරුවූ සංයෝජනයාගේ; ආයතිං අනුප්පාදො හොති, [මාර්ගඵලාදියට පැමිණීමෙන්] මතෙහයි

ඉපදීමක් නොවේද; තඤ්චපජානාති; එද දන්නේය—

> ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති වය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති සමුදය වයධම්මානුපස්සීවා ධම්මෙසු විහරති—අත්ථි ධම්මාති වාපනස්ස සතිපච්චුපට්ඨිතාහොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතොච විහරති නචකිඤ්චිලොකෙ උපාදියති එවංඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු—

ඉති, මෙසේ; අජ්ඣත්තංවා, ආධ්‍යාත්මිකවූහෝ; ධම්මෙසු, [චක්ෂු ශ්‍රොත ඝ්‍රාණ ජිව්හා කායමනඃයන ආයතන] ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, [චක්ෂුආදි ඒ ඒ ආයතන] ධර්මයන්ගේ ස්වභාවාදි නවසිහිකිරීම්වසයෙන් අනුවබලමින්; විහරති, වාසය කරන්නේය; බහිද්ධාවා ධම්මෙසු, බාහිරායතන ධර්මයන්කෙරෙහිහෝ; ධම්මානුපස්සී, [යථොක්ත ක්‍රමයෙන් ආයතන] ධර්මයන් අනුවබලමින්; විහරති, වාසයකරන්නේය; අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු, ආධ්‍යාත්මිකවූහෝ බාහිරවූහෝ [ඒ ඒ ආයතන] ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, ඔවුනොවුන් අනුවබලමින්; විහරති, වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, [ඒ ඒ ආයතන] ධර්මයන්ගේ උත්පත්තියට කාරණවූ [අවිද්‍යාදි හේතු] ධර්මයන් අනුව දක්නේහෝ; ධම්මෙසු විහරති, [මාදශායතන] ධර්මයන් මෙනෙහි කෙරෙමින් වාසය කරන්නේය; වය ධම්මානුපස්සීවා, [අවිද්‍යාදිහේතු] ධර්මයන්ගේ විනාසය අනුව දක්නේහෝ; ධම්මෙසු විහරති. ආයතන ධර්මයන් මෙනෙහිකිරීමෙන් වාසය කරන්නේය; සමුදය වය ධම්මානුපස්සීවා, [චක්ඛාදි ඒ ඒ ආයතන] ධර්මයන්ගේ උත්පත්ති විනාසවසයෙන් බලන්නේහෝ; ධම්මෙසු විහරති, ආයතනධර්මයන් සිහිකිරීමෙන් වාසයකරන්නේය; අස්සපන. [ආයතනයන්ගේ ස්වරූපාදි නවඅනුව බලමින් වාසයකරණ] ඒ යෝගාවචරයා හට වනාහි; අත්ථිධම්මාති, [රූපාරූප] ධර්මමාත්‍රවූ ආයතනයන් ඇත්තේය, [පරමාර්ථවසයෙන් නුවනින්සලකා ගතයුතු සත්වපුද්ගලාදි කිසිවක් නැත්තේයයි කියාහෝ;] සතිපච්චුපට්ඨිතා හොති, සිහිය පිහිටුවන ලද්දේය; යාවදෙව, යම් ඒ සිහියක් මනාව පිහිටුවන ලද්දෙද ඒ සිහිය;

ඤාණමත්තාය, මතුමත්තෙහි ඤාණයාගේ වැඩීම පිණිසද; ප තිස්සතිමත්තාය, ස්මෘතියගේ වැඩීම පිණිසද; අනිස්සිතොච විහරති, [තෘෂ්ණාදෘෂ්ටියන පාපධර්මයන්ගෙන්] දුරුව වාසය කරන්නේය ඒ සියළු අවැඩදායකවූ තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනා, නොගෙරන්මිදුනු හෙතෙම, ලොකෙ, (රූපාරූප ධර්මවූ මේ ආයතන] ලෝකයෙහි; කිචි, කිසිරූපාදියක්; නචඋපාදියති ආත්මාදි වසයෙන් ග්‍රහණය නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, යෝගාවචරතෙම; එවංඛො, මෙසේවනාහි; ඡසු අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු ධම්මෙසු, ආධ්‍යාත්මික බාහිරවසයෙන් විප්‍රකාරවූ වාදශායතන ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී විහරති, ආයතන ධර්මයන් අනුවබලමින් වාසය කරන්නේය—

ආයතන නිද්දෙසං

මෙසේ ආධ්‍යාත්මික බාහිර ආයතන ධර්මයන්ගේ වසයෙන් ධම්මානුපස්සනා භාවනාව විභාගකොට දක්වාවදාළ දැන් බොධ්‍යඞ්ග ධර්මයන්ගේ වසයෙනුදු ප්‍රකාශකොට දක්වනු පිණිස ත්‍රෛලොකෙක තිලක අපභාග්‍යවත් බුදුරජානන් වහන්සේ පුනචපරං යනාදීන් වදාළසේක—

(22) පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු කථංච භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු ඉධභික්ඛවෙ භික්ඛු සන්තංවා අජ්ඣත්තං සති සම්බොජ්ඣඞ්ගං අත්ථිමෙ අජ්ඣත්තං සති සම්බොජ්ඣඞ්ගොති පජානාති අසන්තංවා අජ්ඣත්තං සති සම්බොජ්ඣඞ්ගං නත්ථිමෙ අජ්ඣත්තං සතිසම්බොජ්ඣඞ්ගොති පජානාති යථාච අනුප්පන්නස්ස සති සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදොහොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස සති සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරීහොති තඤ්චපජානාති—

භික්ඛවෙ, මහණෙනි; පුනචපරං, නැවතද; භික්ඛු, යෝගාවචර භික්ෂුතෙම; සත්තසු බොජ්ඣඞ්ගෙසු ධම්මෙසු, සප්ත බොධ්‍යඞ්ග ධර්මයන් කෙරෙහි; ධම්මානුපස්සී, බොධ්‍යඞ්ග ධර්මයන් අනුවබලමින් (ධම්මානු පස්සනා භාවනාවෙහි යෙදී) විහරති, වාසයකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු,

Digitized by Google

[භාවනානුයොග] භික්‍ෂුතෙම; සන්තඤ්ච බොජ්ඣඞ්ගඤ්ච ධම්මඤ්ච, සප්තබොධ්‍යඞ්ග ධර්‍මයන් කෙරෙහි; ධම්මානුපස්සී, බොධ්‍යඞ්ගධර්‍මයන් අනුවබලමින්; කථඤ්චවිහරති, කෙසේවාසයකරන්නේද; භික්ඛවෙ, මහණෙනි; ඉධ, මේශාසනයෙහි; භික්ඛු, යෝගාවචර භික්‍ෂුතෙම; සන්තංවා, [සන්තනයෙන් සිත්හි හැසිරීම්වසයෙන්] විද්‍යමාණවූහෝ; අජ්ඣත්තං, [ප්‍රතිලාභව තමාකෙරෙහිඇති]අධ්‍යාත්මිකවූ;සතිසම්බොජ්ඣඞ්ගං,[යොනිසො මණසිකාරාදීන් උපදනා සිහියයි කියනලද] සතිසං බොධ්‍යඞ්ගය; මෙ, මාගේ; අජ්ඣත්තං, අධ්‍යාත්මිකවූ, සතිසම් බොජ්ඣඞ්ගො, සතිසං බොධ්‍යඞ්ගය තෙම; අත්‍ථීති පජානාති, [දැන් තමාකෙරෙහි] ඇතැයි දන්නේය; අසන්තංවා අජ්ඣත්තං, තමාකෙරෙහි නැත්තාවූහෝ; සතිසම්බොජ්ඣඞ්ගො, සතිසං බොධ්‍යඞ්ගය තෙම; මෙ, මාගේ; අජ්ඣත්තං, අධ්‍යාත්මිකවූ; සතිසම්බොජ්ඣඞ්ගො, සතිසං බොධ්‍යඞ්ගයතෙම; නත්‍ථීති පජානාති, තමාකෙරෙහි නැතැයි දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස සතිසම්බොජ්ඣඞ්ගස්ස, [ප්‍රතිලාභ වසයෙන් තමාකෙරෙහි] නූපන් සතිසං බොධ්‍යඞ්ගයාගේ; උප්පාදො හොති, ඉපදීම වේද හෙවත් නුවනින්යෙදී සැලකීම් මූලා ජනයන්ගෙන් දුරුවීම් එළඹ සිටි සිහිය ඇති පුද්ගලයන් සේවනය කිරීම් මනා සිහිය උතුමැයිසිතා එහිනැමීම්වසයෙන් සිත්ඇතිව වාසයකිරීම් යනමේ කාරණයන් හේතුකොටගෙණ බොධ්‍යඞ්ගයාගේ ඉපදීමවේද; තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස සති සම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූ සතිසං බොධ්‍යඞ්ගයාගේ; භාවනාය;[විපුලභාවයෙන් වඩන්නාවූ] භාවනාව; පාරිපූරීහොති, [ඒ යොගාවචරයා හට අර්‍හත්මාර්ගයට පැමිණීමෙන්ම] සම්පූර්‍ණ වන්නේය; තඤ්ච පජානාති, එද දන්නේය—

සන්තංවා අජ්ඣත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං අත්‍ථිමෙ අජ්ඣත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගොති පජානාති අසන්තංවා අජ්ඣත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං නත්‍ථිමෙ අජ්ඣත්තං ධම්මවිචය සම්බොජ්ඣඞ්ගොති පජානාති යථාච අනුප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස උප්පාදොහොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්චපජානාති—

Digitized by Google

සනතංවා අජ්ඣත්තං, තමාකෙරෙහි විද්‍යමානව ඇත්තාවූ හෝ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං, [පඤ්චස්කන්ධධාතු ආයතනාදි ධර්‍මයන් විමසීම්වසයෙන් සිත්හිපවත්නා] ධම්මවිචය සම්බොධ්‍යඞ්ගය සිහිකොටගෙණ; මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො, [යථොක්ත ප්‍රකාරවූ] ධම්මවිචයසං බොධ්‍යඞ්ගය තෙම; අත්ථීති පජානාති, [දැන් මාකෙරෙහි] ඇතැයි දන්නේය; අසනතංවා අජ්ඣත්තං, තමාකෙරෙහි අවිද්‍යමාණවූහෝ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගං, ධම්මවිචයසං බොධ්‍යඞ්ගය; මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; ධම්මවිචය සම්බොජ්ඣඞ්ගො, [යථොක්ත ප්‍රකාරවූ] ධම්මවිචයසං බොධ්‍යඞ්ගයතෙම, නත්ථීතිපජානාති, [දැන්මාකෙරෙහි නැතැයිකියා දන්නේය; යථාච, යම් කාරණයකින්; අනුප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, [ප්‍රතිලාභවසයෙන්] තමාකෙරෙහි නූපන් ධම්මවිචයසං බොධ්‍යඞ්ගයාගේ; උප්පාදොහොති, ඉපදීමවේද හෙවත් ස්කන්ධ ධාතු ආයතන ඉන්‍ද්‍රියබල බොධ්‍යඞ්ගමාර්‍ගී ශ්‍රුත්ථසමථ විදර්ශනා යනමේ ධර්‍මයන්ගේ අර්ත්ථ නිශ්‍රිතයෙන්හා සර්‍වා විශ්‍යී සතිසමාධි ප්‍රඥායන මොවුන්ගේ සම්භාවනා හේතුකොටගෙන] ධර්‍මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ ඉපදීම වන්නේය; තම පජානාති, ඒ කාරණයද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස ධම්මවිචය සම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූ ධම්මවිචය සම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, (විපුලභාවනායෙන් වඩන්නාවූ) භාවනාව; පාරිපූරිහොති, (ඒ යෝගාවචරයාහට අර්හත්මාර්ගීයට පැමිණීමෙත්ම) සම්පූර්ණ වන්නේය; තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය—

> සනතංවා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං අත්ථීමෙ අජ්ඣත්තං විරිය සම්බොජ්ඣඞ්ගොති පජානාති අසනතංවා අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගං නත්ථීමෙ අජ්ඣත්තං විරියසම්බොජ්ඣඞ්ගොති පජානාති යථාච අනුප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදොහොති තඤ්චපජානාති යථාච උප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරිහොති තඤ්චපජානාති—

සනතංවා අජ්ඣත්තං, තමාකෙරෙහි විද්‍යමානව ඇත්තාවූ හෝ; විරියසම්බොජ්ඣඞ්ගං, (නීවරණවබාධක අකුසලධර්‍මයන්

තමාකරා නොපැමිණෙන පිළිවෙත් සාධකවූ) වීය්‍යීසං බොධ්‍යඞ්ගය, මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ, විරියසම්බොජ්ඣඞ්ගො, වීය්‍යීසං බොධ්‍යඞ්ගය තෙම; අත්ථීති, (දැන් තමංකෙරෙහි) ඇතැයි; පජානාති, දන්නේය; යථාච, යම් කාරණයකින්; අනුප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස, (ප්‍රතිලාභවසයෙන්) නූපන් වීය්‍යීසම්බොධ්‍යඞ්ගයාගේ ප්‍රතිලාභවසයෙන් ඉපදීම වේද; තඤ්චපජානාති, ඒ කාරණය දදන්නේය; යථාච, යම් කාරණයකින්, උප්පන්නස්ස විරියසම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූවීය්‍යී සම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, (බොහෝවසයෙන් වැඩීමෙන් විපුලවූ) භාවනාව; පාරිපූරිහොති, (ඒ යෝගාවචරයාහට රහත්වීමට පැමිණීමෙන්ම) එම බොධ්‍යඞ්ගයාගේ සම්පූර්ණභාවය වන්නේය; තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය—

> සන්තංවා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං අත්ථිමෙ අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගොති පජානාති අසන්තංවා අජ්ඣත්තං පීතිසම්බොජ්ඣඞ්ගං නත්ථිමෙ අජ්ඣත්තංපීතිසම්බොජ්ඣඞ්ගොති පජානාතියථාචඅනුප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති යථාච උප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරිහොති තඤ්චපජානාති.

සන්තංවා අජ්ඣත්තං, (ප්‍රතිලාභවසයෙන්) තමාකෙරෙහි විද්‍යමානව ඇත්තාවූහෝ, පීතිසම්බොජ්ඣඞ්ගං, ප්‍රීතිසං බොධ්‍යඞ්ගය; මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ, පීතිසම්බොජ්ඣඞ්ගො,(යථොක්ත ප්‍රකාරවූ) ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය තෙම; අත්ථීතිපජානාති, [දැන්මාකෙරෙහි] ඇතැයිදන්නේය; අසන්තංවා අජ්ඣත්තං, තමාකෙරෙහි අවිද්‍යමානවූහෝ; පීතිසම්බොජ්ඣඞ්ගං, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය; මෙ; මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; පීතිසම්බොජ්ඣඞ්ගො, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය; නත්ථීති පජානාති, [තමාකෙරෙහි] නැතැයි දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස,[ප්‍රතිලාභවසයෙන්] නූපන් ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යාගේ; උප්පාදො, හොති, ඉපදීම වේද;තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය; යථාච, යම් කාරණයකින්; උප්පන්නස්ස පීතිසම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූ ප්‍රීතිසම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය,[බොහොවසයෙන් වැඩීමෙන් විපුලවූ] භාවනාව; පාරිපූරිහොති,

Digitized by Google

ඒ යෝගාවචරයාහට අර්හත්මාර්ගයට පැමිණීමෙන්මසම්පූර්ණ
වන්නේය; තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය—

සන්තංවා අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං අත්ථි
මෙ අජ්ඣත්තං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගොති පජානා
ති අසන්තංවා අජ්ඣත්තං පස්සද්ධි සම්බොජ්ඣඞ්ගං
නත්ථිමෙ අජ්ඣත්තං පස්සද්ධි සම්බොජ්ඣඞ්ගොති ප
ජානාති යථාච අනුප්පන්නස්ස පස්සද්ධි සම්බොජ්ඣ
ඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති යථාච
උප්පන්නස්ස පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය
පාරිපූරිහොති තඤ්චපජානාති—

සන්තංවා අජ්ඣත්තං, [ප්‍රතිලාභවශයෙන්] තමාකෙරෙහි වි
ද්‍යමානව ඇත්තාවූහෝ; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගං, [කායචිත්ත
දෙදෙනාගේ සංසුන් ස්වභාවයයි කියනලද] පස්සද්ධිසම්බො
ධ්‍යඞ්ගය [තමාකෙරෙහි පවත්නාබව සිහිකොටගෙණ;] මෙ,
මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො,
[කායචිත්ත දෙදෙනාගේ සංසුන් ස්වභාවයයි කියනලද] ප
ස්සද්ධිසම්බොධ්‍යඞ්ගයතෙම; අත්ථි පජානාති; [දැන් මාකෙ
රෙහි] ඇතැයිදන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්
නස්ස පස්සද්ධි සම්බොජ්ඣඞ්ගස්ස, [ප්‍රතිලාභවශයෙන්] නූපන්
පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයාගේ; උප්පාදො හොති, [යෝනිසො
මණස්කාරයයි කියනලද නුවණින් සැලකීමෙන්හා කායචිත්
ත දෙදෙනාගේ සංසිඳුවීමෙන් පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයාගේ]
ඉපදීමවේද; තඤ්චපජානාති, ඒකාරණයද දන්නේය යථාච,
යම් කාරණයකින්; උප්පන්නස්ස පස්සද්ධිසම්බොජ්ඣඞ්ගස්ස,
උපන්නාවූ පස්සද්ධි සම්බොධ්‍යඞ්ගයාගේ; භාවනාය, [බො
හෝ වශයෙන් වැඩීමෙන් විපුලවූ] භාවනාව; පාරිපූරිහොති,
[ඒ යොගාවචරයා හට අර්හත්මාර්ගයට පැමිණීමෙන්ම] සම්පූ
ර්ණවන්නේය; තඤ්චපජානාති, ඒකාරණයද දන්නේය—

සන්තංවා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං අත්ථිමෙ
අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගොති පජානාති-අස
න්තංවා අජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගං නත්ථිමෙඅ
ජ්ඣත්තං සමාධිසම්බොජ්ඣඞ්ගොති පජානාති, යථා
ච අනුප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො
හොති තඤ්චපජානාති, යථාච උප්පන්නස්ස සමාධිස

Digitized by Google

බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති—

සන්තං වා අජ්ඣත්තං, විද්‍යමානව තමා කෙරෙහි ඇත්තාවූ හෝ; සමාධිසම්බොජ්ඣඞ්ගං, (සිත එකඟවීම ලක්‍ෂණකොට ඇති) සමාධිසම්බෝධ්‍යඞ්ගය; මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; සමාධි සම්බොජ්ඣඞ්ගො, සමාධි සම්බෝධ්‍යඞ්ගය තෙම; අත්ථීති පජානාති, දැන් තමාකෙරෙහි ඇතැයි දන්නේය; අසන්තං වා අජ්ඣත්තං, (ප්‍රතිලාභ වසයෙන්) තමාකෙරෙහි නැත්තාවූහෝ; සමාධිසම්බොජ්ඣඞ්ගං, (සිත එකඟවීම ලක්‍ෂණකොටඇති) සමාධිසම්බෝධ්‍යඞ්ගය තෙම; මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; සමාධිසම්බොජ්ඣඞ්ගො, සමාධි සම්බෝධ්‍යඞ්ගය තෙම; නත්ථීති පජානාති, (තමාකෙරෙහි) නැතැයි දන්නේය; යථාච, යම් කාරණයකින්; අනුප්පන්නස්ස සමාධිසම්බොජ්ඣඞ්ගස්ස, (ප්‍රතිලාභ) වසයෙන්නූපන් සමාධිසම්බෝධ්‍යඞ්ගයාගේ; උප්පාදො හොති, (කිසි අරමුණක් සිතිංගෙණ නුවණින් සැලකීමෙන් සමාධිසම්බෝධ්‍යඞ්ගයාගේ) ඉපදීමවේද; තඤ්ච පජානාති, ඒ කාරණයද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස සමාධි සම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූ සමාධිසම්බෝධ්‍යඞ්ගයාගේ; භාවනාය, (බොහෝවසයෙන් වැඩීමෙන් විපුලවූ) භාවනාව; පාරිපූරීහොති, (රහත්මගට පැමිණීමෙන්ම) සම්පූර්ණ වන්නේද; තඤ්චපජානාති, ඒ කාරණයද දන්නේය—

සන්තං වා අජ්ඣත්තං උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගං අත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති පජානාති අසන්තං වා අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං නත්ථි මෙ අජ්ඣත්තං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගොති පජානාති යථා ච අනුප්පන්නස්ස උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස උප්පාදො හොති තඤ්ච පජානාති යථා ච උප්පන්නස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස භාවනාය පාරිපූරී හොති තඤ්ච පජානාති—

සන්තං වා අජ්ඣත්තං, (ප්‍රතිලාභවසයෙන්) තමාකෙරෙහි විද්‍යමානව ඇත්තාවූහෝ; උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං, (සත්වසංස්කාරයන් කෙරෙහි මැදහත්භාවයයි කියනලද) උපෙක්‍ෂා සංබෝධ්‍යඞ්ගය (ඇතිබව සිහිකොටගෙණ;) මෙ, මාගේ; අජ්ඣත්තං, ආධ්‍යාත්මිකවූ; උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, උපෙක්‍ෂා

සංබොධ්‍යඞ්ගය තෙම; අත්ථීතිපජානාති, (දූත් මාකෙරෙහි) ඇතැයි දන්නේය; අසන්තංවා අජ්ඣත්තං, (ප්‍රතිලාභවසයෙන්) තමාකෙරෙහි නැත්තාවූහෝ; උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං, උපෙක්ෂා සංබොධ්‍යඞ්ගය තෙම; මෙ, මාගේ; අජ්ඣත්තං, අධ්‍යාත්මිකවූ; උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, උපෙක්ෂා සංබොධ්‍යඞ්ගය; නත්ථීති පජානාති, (තමාකෙරෙහි) නැතැයි දන්නේය; යථාච, යම්කාරණයකින්; අනුප්පන්නස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස, (ප්‍රතිලාභවසයෙන් තමාකෙරෙහි) නූපන් උපෙක්ෂා සංබොධ්‍යඞ්ගයාගේ; උප්පාදොහොති, ඉපදීමවේ; තංපජානාති, ඒ කාරණයද දන්නේය; යථාච, යම්කාරණයකින්; උප්පන්නස්ස උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගස්ස, උපන්නාවූ උපෙක්ෂා සංබොධ්‍යඞ්ගයාගේ භාවනාය, (බොහෝවසයෙන් වැඩීමෙන් විපුලවූ) භාවනාව; පාරිපූරිහොති, (ඒ යෝගාවචරයාහට රහත්මගට පැමිණීමෙන්ම) සම්පූර්ණ වන්නේය; තංපජානාති, එදදන්නේය—

ඉති අජ්ඣත්තංවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති බහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු ධම්මානුපස්සී විහරති සමුදය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති වය ධම්මානුපස්සීවා ධම්මෙසු විහරති—අත්ථි ධම්මාති වාපනස්ස සතිපච්චුපට්ඨිතාහොති යාවදෙව ඤාණමත්තාය පතිස්සතිමත්තාය අනිස්සිතොච විහරති නචකිඤ්චි ලොකෙ උපාදියති එවංඛො භික්ඛවෙ භික්ඛු ධම්මෙසු ධම්මානුපස්සී විහරති සත්තසු බොජ්ඣඞ්ගෙසු—

ඉති, මෙසේ; අජ්ඣත්තංවා ධම්මෙසු; තමාකෙරෙහි ඇත්තාවූයෝ සප්තබොධ්‍යඞ්ග ධර්මයන්කෙරෙහි (හෙවත් දුක්ඛසමුද නිරෝධමාර්ගයන චතුස්සත්‍යයන්දක්නා ඥාණය බොධී නම්වෙයි ඒ උතුම් මාර්ගඥාණ ධර්මයට පැමිණෙන්නහු විසින් සියළු ධර්මානු සිහිය වීර්‍ය්‍යය ප්‍රීතිය කායචිත්ත දෙදෙනාගේ සන්සිඳීමය සිතඑකඟවීමය මැදහත්බවය යනමේ සප්තබොධ්‍යඞ්ග ගුණධර්මයන්ගේ පිළිවෙළවූ පරිද්දෙන් වඩාගොස් බුදු රහත්බවට පැමිණීමෙන් චතුස්සත්‍යාව බොධය වනහෙයින් ඒ ගුණධර්මයෝ සත්දෙනද බොජ්ඣඞ්ගනම්වෙත් එසේවූ බොධ්‍යඞ්ගධර්මයන් කෙරෙහිහෝ;) ධම්මානුපස්සී විහරති,

Digitized by Google

ඒ බොජ්ඣඞ්ග ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; බහිද්ධාවා ධම්මෙසු, අනුන්පිළිබඳ බොජ්ඣඞ්ග ධර්මයන්කෙරෙහිහෝ; ධම්මානුපස්සී විහරති, ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; අජ්ඣත්තබහිද්ධාවා ධම්මෙසු, අධ්‍යාත්මිකවූහෝ බාහිරවූහෝ බොජ්ඣඞ්ග ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී විහරති, ධර්මයන් අනුවබලමින් වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, (සතිසම්බොජ්ඣඞ්ග ධර්මයන්ගේ) ඉපදීමපිණිස පවත්නා යොනිසොමණසිකාරාදී ධර්මයන්ගේ ස්වභාවවශයෙන් දක්නේහෝ; ධම්මෙසු විහරති, (මාර්ගඥානයාගේ ප්‍රතිලාභයට කාරණාවූ බොජ්ඣඞ්ග) ධර්මයන් මෙනෙහිකරමින් වාසයකරන්නේය; වය ධම්මානුපස්සීවා; (ඒ ඒ බොජ්ඣඞ්ග ධර්මයන්ගේ) විනාසයපිණිස පවත්නාවූ අවිද්‍යාදී හේතුධර්මයන් දක්නේහෝ; ධම්මෙසු විහරති, බොජ්ඣඞ්ගධර්මයන් මෙනෙහිකිරීමෙන් වාසයකරන්නේය; සමුදය ධම්මානුපස්සීවා, බොජ්ඣඞ්ග ධර්මයන්ගේ උත්පත්ති විනාස දක්නේහෝ; ධම්මෙසු විහරති, බොජ්ඣඞ්ග ධර්මයන් මෙනෙහිකරමින් වාසයකරන්නේය; අස්සපන, (භාවනානුයෝගවූ) ඒ යෝගාවචරයාහට වනාහි; අත්‍ථිධම්මාතිවා, බොජ්ඣඞ්ගධර්මයන් ඇතැයියනු; සතිපච්චුපට්ඨිතාහොති, සිහිය පිහිටුවනලද්දේය; යාවදෙව, බොජ්ඣඞ්ගධර්මයෝ ඇතැයියන යම්සිහියෙක් පිහිටුවන ලද්දේද ඒ සිහිය; ඤාණමත්තාය, මතුමත්තෙහි ඤාණයාගේ වැඩීමපිණිසද; පතිස්සති මත්තාය, (ස්මෘතිසංඛ්‍යාත) සිහියගේවැඩීමපිණිසද; අනිස්සිතොච විහරති, (සසරඉපදීමට කාරණාවූ තෘෂ්ණාදෘෂ්ටි දෙදෙනාගෙන්) දුරුව වාසය කරන්නේය; ලොකෙ, ලෝකයෙහි; කිඤ්චි, කිසිවක්; නචඋපාදියති, නිත්‍ය සාරවශයෙන් ග්‍රහණය නොකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භාවනානුයොග භික්ෂුතෙම; එවංඛො, මෙසේවනාහි; සත්තසු බොජ්ඣඞ්ගෙසු ධම්මෙසු, සප්තබොජ්ඣඞ්ග ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී විහරති, ඒ ඒ බොජ්ඣඞ්ග ධර්මයන් අනුවසිතයොදා නුවණින් සිහිකරමින් වාසයකරන්නේය.

බොජ්ඣඞ්ග නිද්දෙසං

පඨමක භාණවාරං

මෙසේ සප්තබොජ්ඣඞ්ග ධර්මයන්ගේ වශයෙන් ධම්මානුපස්සනා භාවනාව විභාගකොට දක්වාවදාළ දුක් චතුරාර්‍ය

සත්‍යධර්මයන්ගේ වශයෙන්වූ ධම්මානුපස්සනාව ප්‍රකාශකොට දක්වනුපිණිස සුගත තථාගතවූ ධර්මචක්‍රඇති ත්‍රෛලෝක්‍යෛක තිලක ලෝකස්වාමීවූ අප භාග්‍යවත් බුදුරජානන් වහන්සේ පුනචපරංභික්ඛවෙ යනාදීන් වදාළසේක—

(23) පුනචපරං භික්ඛවෙ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු කථඤ්ච භික්ඛවෙ භික්ඛු ධම්මේසු ධම්මානුපස්සී විහරති චතූසු අරියසච්චෙසු ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති—

භික්ඛවෙ, මහණෙනි; පුනචපරං, නැවතද; භික්ඛු, යොගාවචරතෙම; චතූසු අරියසච්චෙසු ධම්මෙසු, චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී, චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් අනුව බලමින්; විහරති, වාසයකරන්නේය; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, යොගාවචර භික්ෂූතෙම; චතූසු අරියසච්චෙසු, චතුස්සත්‍ය ධර්මයන්කෙරෙහි; ධම්මානුපස්සී, ආර්‍ය්‍යධර්මයන් අනුවබලමින්, කථඤ්චවිහරති, කෙසේ වාසයකරන්නේද; භික්ඛවෙ, මහණෙනි; භික්ඛු, භාවනානුයොග භික්ෂූතෙම; ඉධ, මේශාසනයෙහි; ඉදං දුක්ඛන්ති, මේදුඃඛාර්‍ය්‍ය සත්‍යයයිකියා; යථාභූතං පජානාති, තත්වූපරිද්දෙන් දන්නේය; අයං දුක්ඛසමුදයොති, මේ දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයයි කියා; යථාභූතං පජානාති, තත්වූපරිද්දෙන් දන්නේය; අයං දුක්ඛනිරොධොති, මේ දුඃඛනිරොධාර්‍ය්‍ය සත්‍යයයිකියා; යථාභූතංපජානාති, තත්වූපරිද්දෙන් දන්නේය; අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති, මෙදුක් නිරුධකිරීමටයන පිළිපැදීමයයි කියා; යථාභූතංපජානාති; තත්වූපරිද්දෙන් දන්නේය—

(24) කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං ජාතිපිදුක්ඛා ජරාපිදුක්ඛා ව්‍යාධිපිදුක්ඛා මරණම්පිදුක්ඛං සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා යම්පිච්ඡං නලභති, තම්පිදුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා—

භික්ඛවෙ, මහණෙනි; දුක්ඛං අරියසච්චං, දුඃඛාර්‍ය්‍ය සත්‍යය;

Digitized by Google

කතමඤ්ච, කවරක්ද; ජාතිඅපි, ජාතිය හෙවත් ඉපදීමද; දුක්ඛා, දුක්වන්නීය; ජරාඅපි, ජරාවහෙවත් දිරීමද; දුක්ඛා, දුක්වන්නීය; ව්‍යාධිඅපි, ව්‍යාධියහෙවත් රෝගයද; දුක්ඛා, දුක්වන්නීය; මරණංඅපි, මරණයද; දුක්ඛං, දුක්වන්නේය; සොක, සොකකිරීමය; පරිදෙව, වැළපීමය; දුක්ඛ, කයහට ගන්නාදුකය; දොමනස්ස, සිතහටගන්නා දොම්නසය; උපායාස, දැඩිආයාසය යනමොහු; දුක්ඛා, දුක්වන්නාහුය; යම්පිච්ඡං, යම් කැමතිදෙයක් හෙවත් යමක්පතමින්; නලභති, නොලබාද; තම්පිදුක්ඛං, එද දුක්වන්නේය; සඞ්ඛිත්තෙන, සංක්ෂෙපාර්ථයෙන්; පඤ්චුපාදානක්ඛන්ධා, උපාදානස්කන්ධයෝ පස්දෙන; දුක්ඛා, දුක්වන්නාහුය—

කතමාච භික්ඛවෙජාති–යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො අයංවුච්චති භික්ඛවෙ ජාති—

භික්ඛවෙ, මහණෙනි; ජාතිකතමාච, ජාතියනම් කුමක්ද; තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; තම්හි තම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්වසමූහයෙහි; යාජාති, ඉපදීමයයන යම්සම්මතයක්ඇද්ද; සංජාති, හටගැන්මක්වේද; ඔක්කන්ති, උත්පත්තිස්ථානයට ඇතුළත්වීමක් ඇද්ද; අභිනිබ්බත්ති, විශෙෂයෙන් ඉපදීමක්ඇද්ද; ඛන්ධානං පාතුභාවො, (පරමාර්ථවසයෙන්) ස්කන්ධයන්ගේ පහළවීමෙක් ඇද්ද; ආයතනානං පටිලාභො, (චක්ඛායතනාදී ෂට්) ආයතනයන්ගේ ලැබීමක් ඇද්ද; භික්ඛවෙ, මහණෙනි; අයං, මේතොමෝ; ජාතිවුච්චති, ජාතියයි කියනුලැබේ—

කතමාච භික්ඛවෙ ජරා–යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං පාලිච්චං වලිත්තචතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයංවුච්චති භික්ඛවෙ ජරා—

භික්ඛවෙ, මහණෙනි; ජරාකතමාච, ජරාව කවරෙක්ද; තම්හි තම්හි සත්තනිකායෙ, ඒ ඒ සත්වනිකායෙහි (උපන්නාවූ) තෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්ගේ; යාජරා, යම්ජරාවක් වන්නීද; ජීරණතා, (ජරාවෙන්සත්වයන්) දිරණබවද; ඛණ්ඩිච්චං, (දත්ඈම) කැඩුනබව හෙවත් ගැලවුනබවද; පාලිච්චං,

Digitized by Google

(කෙස් ලොම්) පැසී සුදුවූබවද; වලිත්තචතා, රැලිනැගුණු ස
මින්ඇතිබවද; ආයුනොසංහානි, ආයුසයාගේ හාණියහොවත්
ගෙවීමද; ඉන්ද්‍රියානං පරිපාකො, ඉන්ද්‍රියයන්ගේ මුහුකුරායා
මක්ඇද්ද; භික්ඛවෙ, මහණෙනි; අයංජරාවුච්චති, මේ ජරා
වයයි කියනුලැබේ—

> කතමඤ්ච භික්ඛවෙමරණං—යංතෙසං තෙසංසත්තා
> නං තම්හා තම්හා සත්තනිකායා චුතිච චවනතාභෙ
> දො අන්තරධානං මච්චුමරණං කාලකිරියා ඛන්ධා
> නං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ඉදංවුච්චති
> භික්ඛවෙ මරණං—

භික්ඛවෙ, මහණෙනි; මරණං, මරණයතෙම; කතමඤ්ච,
කවරක්වන්නේද; යංතෙසං තෙසං සත්තානං, ඒ ඒ සත්වයන්
ගේ; තම්හා තම්හා සත්තනිකායා, ඒ ඒ සත්වනිකායෙන්; යාචු
ති, (සත්වයාගේ) යම්චුතවීමක් ඇද්ද; චවනතා, ජීවිතය ගැල
වියනබවද; භෙදො, (පරමාර්ථවසයෙන් ස්කන්ධයන්ගේ) බිඳී
මද; අන්තරධානං, (රූපස්කන්ධාදීන්ගේ) අතුරුදන්වීමද; ම
ච්චුමරණං, (සම්මුති) මරණින් මියයාමද, කාලකිරියා, මර
ණකාලක්‍රියාවද; කලෙබරස්ස නික්ඛෙපො, ශරීරයාගේ දෑ
මීමක්ඇද්ද; ඉදං, මේ කාරණයතෙම; භික්ඛවෙ, මහණෙනි;
මරණංවුච්චති, මරණයයි කියනුලැබේ—

> කතමොච භික්ඛවෙ සොකො—යොඛො භික්ඛවෙ
> අඤ්ඤතරඤ්ඤ තරෙණ ව්‍යසනෙන සමන්නාගතස්ස
> අඤ්ඤතරඤ්ඤ තරෙණ දුක්ඛධම්මෙන ඵුට්ඨස්සසො
> කො සොචනාසො චිත්තත්තං අන්තො සොකො අ
> න්තොපරිසොකො අයංවුච්චති භික්ඛවෙ සොකො-

භික්ඛවෙ, මහණෙනි; සොකො, සොකයතෙම; කතමො
ච, කවරක්වන්නේද; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරඤ්ඤ
තරෙණ ව්‍යසනෙන, නොයෙක් ප්‍රභෙද ව්‍යසනයන් අතුරෙ
න් එක්තර ව්‍යසනයකින්; සමන්නාගතස්ස, වැලඳගැන්මෙ
න් යුක්තවූ සත්වයාගේද; අඤ්ඤතරඤ්ඤ තරෙණ දුක්ඛධම්
මෙන, (සිරගෙයිවැටී බැඳුම්ලැබීම් ආදිවූ) නානාප්‍රකාරවූ දු
ක්ඛස්වභාවන් අතුරෙත් එක්තර එකක් විසින්; ඵුට්ඨස්ස, ස්ප
ර්ශකොට වැලඳගත්තාහුගේද; යොඛො සොකො, යම් සො
කකිරීමක්ඇද්ද; සොචනා, ශරීරාභ්‍යන්තරය වියලන ස්වභා

Digitized by Google

මෙන් සොකකරණ බවය; සොචිතත්තං, ශොකසළබවය, අන්තො සොකො, [මුඛ නාසා කත්සිඳුරුආදී] ශරීරාභ්‍යන්තරය හාත්පසින් වියලන සවභාවවූ යමක්වේද; අයං, මේතෙම; භික්ඛවෙ, මහණෙනි; සොකොවුච්චති, සොකයයි කියතුලැබේ—

> කතමොච භික්ඛවෙ පරිදෙවො-යොඛොභික්ඛවෙ අඤ්ඤතරඤ්ඤ තරෙණ ව්‍යසනෙන සමන්නාගතසස අඤ්ඤතරඤ්ඤ තරෙණ දුක්ඛධම්මෙන ඵුට්ඨසස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවි තත්තං අයංවුච්චති භික්ඛවෙ පරිදෙවො—

භික්ඛවෙ, මහණෙනි; පරිදෙවො, පරිදෙවයතෙම; කතමොච, කවරස්වන්නේද; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරඤ්ඤතරෙණ ව්‍යසනෙන සමන්නාගතසස, [ඥාති ව්‍යසනාදී] නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන් එක්තරා ව්‍යසනයකින් සමන්විතවූ සත්වයාගේද; අඤ්ඤතරඤ්ඤතරෙණ දුක්ඛධම්මෙන ඵුට්ඨසස, එක්තරා කිසිදුකට කාරණයකින් යටකරණලද පුද්ගලයාගේද; යොඛො ආදෙවො, නම්පමණකියා හැඬීම වූ යම් ආදෙවයක්ඇද්ද; පරිදෙවො, ගුණවර්ණනා කොට හැඬීමවූ පරිදෙවය; ආදෙවනා, නම්කියා හැඬීමවූ ආදෙවනාය; පරිදෙවනා, ගුණවර්ණනාකොට හැඬීමය; ආදෙවිතත්තං, නම්කියාහැඬුමේ සවභාවය; පරිදෙවිතත්තං, ගුණවර්ණනාකොට හැඬුමේ සවභාවය; භික්ඛවෙ, මහණෙනි; අයං, මේතෙම; පරිදෙවොවුච්චති, පරිදෙවයයි කියතුලැබේ—

> කතමඤ්චභික්ඛවෙ දුක්ඛං යංඛොභික්ඛවෙ කායිකං දුක්ඛං කායිකං අසාතං කායසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදංවුච්චති භික්ඛවෙ දුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; දුක්ඛං කතමඤ්ච, දුක්ඛය නම් කවරේද; භික්ඛවෙ, මහණෙනි; යංඛොකායිකං දුක්ඛං, යම් කයෙහි හටගත් දුකක්ඇද්ද; කායිකං, කයෙහිහටගත්තාවූ; අසාතං, නොමිහිරිවූ අපාසුකාරණය; කායසම්ඵස්සජං, කය හා එක්ව ස්පර්ශවීමෙන් උපන්නාවූ; අසාතංවෙදයිතං, කයික වෙදනාමවූ; දුක්ඛං, දුකක්වේද; ඉදං. මේ [කයෙහිඋපන් දුක;] භික්ඛවෙ, මහණෙනි; දුක්ඛංවුච්චති, [සවභාවෙන්ම] දුකයයි කියතුලැබේ—

Digitized by Google

කතමඤ්ච භික්ඛවෙ දොමනස්සං යංඛො භික්ඛවෙ චෙතසිකං දුක්ඛං චෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදංවුච්චති භික්ඛවෙ දොමනස්සං—

භික්ඛවෙ, මහණෙනි; දොමනස්සං කතමඤ්ච, * සිතහට ගන්නා දොම්නසනම් කවරේද; භික්ඛවෙ, මහණෙනි; චෙතසිකං, සිතෙහි හටගන්නාවූ; යංඛොදුක්ඛං, යම්දුකක් වනාහිවේද; චෙතසිකං, සිතෙහි හටගත්තාවූ; අසාතං, අමධුර භාවයක් හෙවත් සැපනුවූ බවක්වේද; මනොසම්ඵස්සජං, සිතට [අමනොඥඅරමුණු] ස්පර්ශවීමෙන් උපන්නාවූ; දුක්ඛං, දුකක්වේද; අසාතං වෙදයිතං, සැපනුවූ විඳීමක්වේද; භික්ඛවෙ, මහණෙනි; ඉදං, මේතෙම; දොමනස්සං වුච්චති, දොම්නසයයි කියනුලැබේ—

කතමොච භික්ඛවෙ උපායාසො-යොඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤ තරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤ තරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං අයංවුච්චති භික්ඛවෙ උපායාසො—

භික්ඛවෙ, මහණෙනි උපායාසො කතමොච, † උපායාසයනම් කවරේද; භික්ඛවෙ, මහණෙනි; අඤ්ඤතරඤ්ඤ තරෙන ව්‍යසනෙන, [ඥාතිව්‍යසනාදි නානාප්‍රකාර ව්‍යසනයන් අතුරෙන්] එක්තරායම් ව්‍යසනයකින් යුක්තවූවාහුගේද; අඤ්ඤතරඤ්ඤ තරෙන දුක්ඛධම්මෙන, එක්තරායම් දුඃඛස්වභාවකින්; ඵුට්ඨස්ස, යටකරණ ලද්දෑහුගේ; ආයාසො, [ක්ලාන්තස්වභාවවූ] ආයාසයෙක්ඇද්ද; උපායාසො, බලවත් ආයාසයෙක් ඇද්ද, ආයාසිතත්තං, ක්ලාන්තවූ ස්වභාවය; උපායාසිතත්තං; දැඩික්ලාන්තවූ ස්වභාවය; භික්ඛවෙ, මහණෙනි; අයං, මේතෙම; උපායාසො වුච්චති, උපායාසයයි කියනුලැබේ—

---

* සිතහටගන්නා දුක දොම්නසයයි කියනුලැබේ—

† ශොකය, මදගින්නෙන් භාජනයතුල පැසීමක් සමානය-පරිදෙවය, තියුණුගින්නෙන් පැසී භාජනයෙන්පිට නික්මෙන දෙයක්සමානය-උපායාසය, පිටනික්මීමෙන් ඉතිරිවූවක් පිටනික්මෙන්ටද නොහැකිව ක්ෂයවීමදක්වා භාජනයතුල පැසීම සමානයයි විසුද්ධිමාර්ගයෙහි කියනලදී—

කතමඤ්ච භික්ඛවෙ යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—
ජාතිධම්මානං භික්ඛවෙ සත්තානං එවංඉච්ඡා උ
ප්පජ්ජති අහොවතමයං නජාතිධම්මා අස්සාමනච
වතනොජාති ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡා
යපත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; යම්පිච්ඡංනලභති තම්පිදුක්ඛං, කැමතිවූයමක් නොලබාද හේ දුක්වන්නේය යනු; * කතමඤ්ච, කවරේද; භික්ඛවෙ, මහණෙනි; ජාතිධම්මානං සත්තානං, සසර නොයෙක් ජාතිවල පිළිසිඳගන්නා ස්වභාවඇත්තාවූ සත්වයන්ට; එවංඉච්ඡා, මෙසේතණ්හාවෙක්; උප්පජ්ජති, උපදී; (කෙසේද)මයං, අපි; නජාතිධම්මා අස්සාම, භවයෙහි උපදිනස්වභාව නැතිවන්නමුනම්; නො, අපට; වත, ඒකාන්තයෙන්; ජාති, භවයෙහි හටගැන්ම; නචආගච්ඡෙය්‍ය, නොමඑන්නේනම්; අහොවත, ඉතායෙහෙක; (යනමෙසේය;) එතං, මේකාරණය; ඉච්ඡාය, කැමැත්තෙන්; නඛොපනපත්තබ්බං, පැමිණිය හැකි නොවේ; ඉදම්පි, මේද; යම්පිච්ඡංනලභති තම්පිදුක්ඛං, ආසාකරණලද යමක්නොලබාද; හේදුකය (යනදුක් කොට්ඨාසයක් වන්නේය)—

ජරාධම්මානං භික්ඛවෙසත්තානං එවංඉච්ඡා උප්පජ්ජ
තිඅහොවතමයං න ජරාධම්මා අස්සාමනචවතනො
ජරා ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡායපත්ත
බ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; ජරාධම්මානං, ජරාව ස්වභාකොට ඇත්තාවූ; සත්තානං, ප්‍රාණීන්ට, එවංඉච්ඡා උප්පජ්ජති, මෙසේආසාවෙක් උපදනේය; මයං, අපි; න ජරාධම්මා අස්සාම; ජරාස්වභාවඇති නොවමුනම්; නො, අපට; නචවතජරා ආගච්ඡෙය්‍ය, ඒකාන්තයෙන් ජරාව නොඑන්නේනම්; අහොවත, ඉතායෙහෙක; එතං, මේකාරණය; ඉච්ඡාය, කැමැත්තෙන් නොහොත් ආසාවෙන්; නඛොපන පත්තබ්බං, නොපැමිණිය යුත්තේය; ඉදම්පි, මේද; යම්පිච්ඡංනලභති තම්පිදුක්ඛං, කැමතිවූ යමක්නොලබානම් එදදුක්වන්නේය (සී කියනලද දුකක්වන්නේය)—

---

* නොලැබියහැකි වස්තූන් කෙරෙහි ආලයකිරීමම කැමතිවූ යමක්නොලැබීම දුකයයි ප්‍රකාශ කරණලදී.

ව්‍යාධිධම්මානං භික්ඛවෙසත්තානං එවංඉච්ඡා උප්පජ්ජති අහොවතමයං න ව්‍යාධිධම්මා අස්සාම නචවතනො ව්‍යාධි ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡායපත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; ව්‍යාධි ධම්මානං සත්තානං, රෝග ඇතිවීම ස්වභාවකොට ඇත්තාවූ සත්වයන්ට; එවංඉච්ඡා උප්පජ්ජති, මෙසේ කැමැත්තක් උපදී; මයං, අපි; න ව්‍යාධිධම්මා අස්සාම, රෝගස්වභාව ඇත්තෝනොවමුනම්; නො, අපට; නචවත ව්‍යාධිආගච්ඡෙය්‍ය, ඒකාන්තයෙන් ව්‍යාධියත් නොමපැමිනෙන්නේනම්; අහොවතඉති, ඉතායෙහෙකැයි; එතං, මේ කාරණය; ඉච්ඡාය, ආසාවෙන්; නඛොපන පත්තබ්බං, නොපැමිණිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡංනලභති තම්පිදුක්ඛං, යම්කැමතිදෙයක් නොලබාද ඒත් දුක්වන්නේය, (යනදුකක් වන්නේය)—

මරණධම්මානං භික්ඛවෙ සත්තානං එවංඉච්ඡා උප්පජ්ජති අහොවතමයංන මරණධම්මා අස්සාමනචවතනො මරණං ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡායපත්තබ්බං ඉදම්පියම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; මරණධම්මානං සත්තානං, මැරීම ස්වභාවක්වසයෙන් ඇත්තාවූ සත්වයන්ට; එවංඉච්ඡා, මෙසේ කැමැත්තක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; න මරණධම්මා අස්සාම; මරණ ස්වභාවනැතිවමුනම්; නො, අපට; මරණංනචවත ආගච්ඡෙය්‍ය, ඒකාන්තයෙන් මරණයද නොපැමිනියේනම්; අහොවතඉති, ඉතායෙහෙකැයි; එතං, මේකාරණය; ඉච්ඡාය, ආසාවෙන්; නඛොපන පත්තබ්බං, නොපැමිනිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡංනලභති තම්පිදුක්ඛං, යම්කැමතිදෙයක් නොලබාද ඒත්දුක්වන්නේය(යනදුකක්වන්නේය-

සොකධම්මානං භික්ඛවෙ සත්තානං එවංඉච්ඡා උප්පජ්ජති අහොවතමයං න සොකධම්මා අස්සාම නච වතනො සොකො ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පියම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; සොකධම්මානං, සෝකය ස්වභාවයෙන්ඇත්තාවූ; සත්තානං, ප්‍රාණීන්ට, එවංඉච්ඡා, මෙසේ

Digitized by Google

අසාවක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; නසොකධම්මා අසා
ම්; සෝකය ස්වභාවයෙන් ඇත්තෝ නොවමුනම්; නො, අපට,
සොකො නචවත ආගච්ඡෙය්‍ය, සෝකය ඒකාන්තයෙන්
නොමඑන්නාහුනම්; අහොවතඉති, ඉතායෙහෙකැයි යනු;
එතං, මේකාරණය; ඉච්ඡාය, ආසාවෙන්; නඛොපන පත්ත
බ්බං, නොපැමිණිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡං
නලභති තම්පිදුක්ඛං, යම්කැමතිදෙයක් නොලබාද ඒද දුක්
වන්නේය (යනාදුකක් වන්නේය)—

පරිදෙවධම්මානං භික්ඛවෙසත්තානං එවංඉච්ඡා උ
ප්පජ්ජති අහොවතමයං න පරිදෙවධම්මා අස්සාම
නචවතනො පරිදෙවො ආගච්ඡෙය්‍යාති නඛොපනෙ
තං ඉච්ඡායපත්තබ්බං ඉදම්පියම්පිච්ඡං නලභති ත
ම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; පරිදෙවධම්මානං, හැඬීම් ස්වභාකො
ට ඇත්තාවූ; සත්තානං, ප්‍රාණීන්ට; එවංඉච්ඡා, මෙබඳුආසාව
ක්; උප්පජ්ජති, උපදී; මයං, අපි; නපරිදෙව ධම්මාඅස්සාම, හැ
ඬීම් ස්වභාකොට ඇත්තෝ නොවමුනම්; නො, අපට; පරිදෙ
වො, පරිදේවය හෙවත්හැඬීම; නචවත ආගච්ඡෙය්‍ය, නො
මඑන්නාහුනම්; අහොවතඉති, ඉතායෙහෙකැයියනු; එතං,
මේකාරණය; ඉච්ඡාය, ආසාවෙන්; නඛොපනපත්තබ්බං, නො
පැමිනිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡං නලභති ත
ම්පිදුක්ඛං යම්කැමතිදෙයක් නොලබාද ඒද දුක්වන්නේය
(යනාදුකක් වන්නේය)—

දුක්ඛධම්මානං භික්ඛවෙ සත්තානං එවංඉච්ඡා උප්ප
ජ්ජති අහොවතමයං නදුක්ඛධම්මා අස්සාමනච ව
නොදුක්ඛං ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡා
යපත්තබ්බං ඉදම්පියම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

භික්ඛවෙ, මහණෙනි; දුක්ඛධම්මානං, කායිකදුක්ඛය ස්ව
භාකොටඇත්තාවූ; සත්තානං, ප්‍රාණීන්ට; එවංඉච්ඡා, මෙබ
ඳුආසාවක්; උප්පජ්ජති, උපදී, මයං; අපි; නදුක්ඛධම්මා අස්සා
ම, කායිකදුක්ඛ ස්වභාකොට ඇත්තෝ නොවමුනම්; නො,
අපට; දුක්ඛං, කායිකදුක; නචවතආගච්ඡෙය්‍ය, ඒකාන්ත
යෙන් නොමඑන්නාහුනම්; අහොවතඉති, ඉතායෙහෙකැ
යියනු; එතං, මේකාරණය; ඉච්ඡාය, ආසාවෙන්; නඛොපන

Digitized by Google

පත්තබ්බං, නොපැමිනිය හැක්කේමය; ඉදම්පි, මේද; යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං, යම්කැමතිදෙයක් නොලබාද ඒද දුක්වන්නේය (යනදුකක් වන්නේය)—

දොමනස්සධම්මානං භික්ඛවෙසත්තානං එවංඉච්ඡා උප්පජ්ජති අහොවතමයං නදොමනස්සධම්මා අස්සාම නචවතනො දොමනස්සං ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පියම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං—

